**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

**<u>2026 ජනවාරි 08 දින මහා සභා රැස්වීමේ වාර්තාව</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2026.01.08 දින පෙ.ව 10.00 ට පමණ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පවත්වන්නට යෙදුනු ගරු මහා සභාවේ රැස්වීම් වාර්තාවයි.

1. ගරු සභාපති - ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා
2. ගරු උප සභාපති - ජේ.එම්.එච්. ජයවර්ධන මහතා
3. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා
4. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා
7. ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. නිමල් විජේසේකර මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.වී. රුවිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ජී. සුදත් හේමන්ත මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නීල් නෙල්ෂන් කඩදර මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. රත්නපාල පීරිස් මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී. ධම්මික සනත් රත්නසේකර මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සුමිත් රෝහාන් ප්‍රියදර්ශන මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම් . සුසන්ත අජිත් කුමාර මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ඒ. චන්ද්‍රානි හේමලතා මහත්මිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී. ප්‍රභාෂිනි රුක්ෂි මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා

02 . ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. අමිත මහතා

**<u>ආගම සිහි කිරීම</u>**

පළමුව ආගම සිහි කිරීමෙන් පසුව ගරු මහා සභාවට පැමිණි සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා බවත් ලැබුවා වූ නව වසර සුභ නව වසරක් වේවායි පවසමින් මහා සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**<u>ජාතික විරුවන් සිහි කිරීම</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විනාඩියක නිශ්ශබ්දතාවයක් ගත කරමින් ජාතික විරුවන් සිහි කරන ලදි.

**අ. පසුගිය රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම**

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් මෙදින සභා සම්මත කර ගැනීම සඳහා සභා වාර්තා දෙකක් පවතින බවද වෙන් වෙන් වශයෙන් සභා සම්මත කර ගැනීම කළ යුතු බවද පෙන්වා දෙන ලදි.

ඒ අනුව

**- 2025.12.11 දින ගරු මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම**

2025.12.11 දිනැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත එවා ඇති බවත්, එය කියවූවා සේ සලකා ඒ සම්බන්ධව යම් සංශෝධනයන් වේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුවත් කරන ලදි.

කිසිදු සංශෝධනයක් ඉදිරිපත් නොවූ බැවින්,2025.12.11 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා විසින් යෝජනා කරන ලදි. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර,2025.12.11 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**-2025.12.29 දින විශේෂ මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම**

2025.12.29 දින විශේෂ මහා සභාවේ වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත එවා ඇති බවත්, එය කියවූවා සේ සලකා ඒ සම්බන්ධව යම් සංශෝධනයන් වේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුවත් කරන ලදි.

කිසිදු සංශෝධනයක් ඉදිරිපත් නොවූ බැවින්, 2025.12.29 දින විශේෂ මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය විසින් යෝජනා කරන ලදි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, 2025.12.29 දින විශේෂ මහා සභාවේ වාර්තාව සංශෝධන රහිතව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ආ. සභාපතිතුමාගේ නිවේදන වාරය**

1. රජය විසින් අප වෙත දැනුම් දීමක් කර තිබුණු බවත් අප වෙත මෙන්ම සියලුම රාජ්‍ය ආයතන වළ ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒ අනුව නිකසල පුරයක් සුවබර දිවියක් කියන තේමාව යටතේ ඩෙංගු මර්ධන වැඩසටහනක් අප විසින්ද 7,8,9 යන දින තුනෙදි සහා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ඒ අනුව ඊයේ දිනයේ සමාරම්භක අවස්ථාව සනිටුහන් කළ බවත් අද දිනයේත් යම් යම් ක්‍රියා මාර්ග ඒ වෙනුවෙන් ගන්නා බවත් හෙට දවසේදීත් ඒ සඳහා කටයුතු කරන බවත් සියලු දෙනාගේම ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවත් විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන පළාත් සභා අමාත්‍යංශය විසින් මේ කටයුතු සංවිධානය කර ඇති බවද මේ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් රුවන්වැල්ල පොලිසියත් අපට සහාය ලබාදෙන බවත් අනෙකුත් ආයතන අතර පාසල් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන මේ සියල්ලගේම සහය මේ සඳහා හමු වන බවත් මේ දිනවල මේ කටයුතු සිදුවන බැවින් සහාය බලා දෙන ලෙස ඉල්ලා සිටින බව දන්වා සිටින ලදි.
2. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ වැය දරමින් සේවා අවශ්‍යතාවය මත තොරා ගන්නා ශ්‍රමිකයින් සමඟ බැදීම් ඇති කර ගැනීමෙදී ස්ථිර සේවය සඳහා හිමිකම් නොයිල්ලන බවට හා මාස තුනෙන් තුනට සේවය බණ්ධනය වන පරිදි ගිවිසුම අලුත්වන ආකාරයට රියදුරු තනතුරු එකක් සඳහාද සෞඛ්‍ය කම්කරුවන් තුන් දෙනෙක් සඳහාත් සේවයේ යොදව ගැනීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇති බව දන්වා සිටින ලදි.
3. මෙතෙක් යටියන්තොට ආසනයට සම්බන්ධ වී තිබුණු 107 ගල්පාත වසමත් 108 මත්තමගොඩ ග්‍රාම නිළධාරී වසමත් රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත ලබා දීමට සීමා නිර්ණ කොමිෂන් සභාව තීරණය කර ඇති බව දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදි.ප්‍රායෝගිකව ගත්විට භූගොලියව ජනතාව අපහසුතාවයට පත් වන ලෙස බෙදි තිබුනු බවද ඒ නිසා සීමා නිර්ණ කොමිෂන් සභාව විසින් මේ තීරණය ගෙන තිබෙන බව දන්වා සිටින ලදි.මේ වන විටද සේවා සැපයීම් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය සේවා සපයන්නේ රුවන්වැල්ලෙන් බව පෙන්වා දෙන ලදි. මේ ආකාරයට පැවතීමෙන් ජනතාව අපහසුතාවයට පත් වන බවත් විශාල දුරක් මත්තමගොඩට පැමිණීමෙදී ඇති බව පෙන්වා දෙන ලදි.ඒ නිසා මෙම

යෝජනාව තාමත් සිදු වන බවත් මෙම තීන්දුව නිවැරදිව ප්‍රකාශයට පත් කරන තෙක් මේ වන විට දන්වා ඇත්තේ මෙලෙසින් බව පෙන්වා දෙන ලදි.

පෙ.ව 10.10 පමණ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා ගරු මහා සභාව වෙත පැමිණෙන ලදි.

**ඇ. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය විසින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා මෙදින ගරු මහා සභාව වෙත නොපැමිණෙන බව දන්වා සිටින ලදි.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා විසින් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. අමිත මහතා මෙදින ගරු මහා සභාව වෙත නොපැමිණෙන බව දන්වා සිටින ලදි.

**ඇ. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි සභාවට ඉදිරිපත් කිරීම**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා විසින්, වයි.ඩී ජයවර්ධන ,අලුත්වත්ත ජනපදය,අම්තිරිගල,ලිපිනයෙන් ඉදිරිපත් කර ඇති " මාර්ගයේ කාණුව අවහිර කර ඇති බව දන්වා ඇති ලිපිය සම්බන්ධවයි" ලෙස ලිපියක් ඉදිරිපත්කරන ලදි.

**ඉ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**-නැත-**

**ඊ. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතාගේ යෝජනා,</u>**

**<u>ඊ - 01</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතුව අඟුරුවැල්ල හා රුවන්වැල්ල යන නගරවල පෙර පාසල් 02 ක් පවත්වාගෙන යන අතර ,ඒ වෙනුවෙන් පෙර පාසල් පාලිකා තනතුරු 02 ක් අනුමතව ඇත.එම අනුමත තනතුරු දෙක වෙනුවෙන් නිළධාරිනියන් දෙදෙනෙකු සේවයේ යෙදෙයි.නමුත් වාර්ෂිකව ළමුන් 60 ට ආසන්න ප්‍රමාණයක් එක් පෙර පාසලක් වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කරන අතර ගුරු මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත මාසික දීමනා ගෙවීමේ පදනම මත සුදුසුකම් ලත් නිළධාරීන් පෙර පාසල් සේවාව පවත්වාගෙන යාම සඳහා සේවයේ යොදවා ගැනීමට සිදු වේ.ඒ අනුව දැනට මාසික දීමනා ගෙවීමේ පදනම මත සේවා ගිවිසුම් යටතේ අවශ්‍ය සුදුසුකම් සහිත නිළධාරිනියන් 05 දෙනෙකු පෙර පාසල් පාලිකා රාජකාරී වෙනුවෙන් යොදවාගෙන ඇති අතර ඔවුන්ට සේවයේ ස්ථිරත්වය ලබා ගතහැකිවන පරිදි මු.රෙ 71 යටතේ දරන්නාට පෞද්ගලික වන සේ පෙර පාසල් පාලිකා තනතුරු 05 ක් ඇති කිරීම සුදුසු බවත් ,ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතුව අඟුරුවැල්ල හා රුවන්වැල්ල යන නගරවල පෙර පාසල් 02 ක් පවත්වාගෙන යන අතර ,ඒ වෙනුවෙන් පෙර පාසල් පාලිකා තනතුරු 02 ක් අනුමතව ඇත.එම අනුමත තනතුරු දෙක වෙනුවෙන් නිළධාරිනියන් දෙදෙනෙකු සේවයේ යෙදෙයි.නමුත් වාර්ෂිකව ළමුන් 60 ට ආසන්න ප්‍රමාණයක් එක් පෙර පාසලක් වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කරන අතර ගුරු මණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත මාසික දීමනා ගෙවීමේ පදනම මත සුදුසුකම් ලත් නිළධාරීන් පෙර පාසල් සේවාව පවත්වාගෙන යාම සඳහා සේවයේ යොදවා ගැනීමට සිදු වේ.ඒ අනුව දැනට මාසික දීමනා ගෙවීමේ පදනම මත සේවා ගිවිසුම් යටතේ අවශ්‍ය සුදුසුකම් සහිත නිළධාරිනියන් 05 දෙනෙකු පෙර පාසල් පාලිකා රාජකාරී වෙනුවෙන් යොදවාගෙන ඇති අතර ඔවුන්ට සේවයේ ස්ථිරත්වය ලබා ගතහැකිවන පරිදි මු.රෙ 71 යටතේ දරන්නාට පෞද්ගලික වන සේ පෙර පාසල් පාලිකා තනතුරු 05 ක් ඇති කිරීම සුදුසු බවත් ,ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඊ - 02**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මකවන ප්‍රදේශයන්හි ඉඩම් සැලසුම් ,ඉඩම් අනු බෙදුම් ,ගොඩනැගිලි සැලසුම් ,අනුකූලතා සහතික නිකුත් කිරීම අනුමත කිරීම පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් සිදු කිරීමටත් ,එම කමිටුව සඳහා සහභාගී වන නිලධාරීන්ට දිනකට කමිටු දීමනාව රු .1000.00 ක මුදල ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු මහා සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව.(සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමාගේ CLG/LG -5/4/1 හා 2023.08.09 දිනැති ලිපිය පරිදි )

1. ගරු සභාපතිතුමා
2. ලේකම්
3. කාර්මික නිළධාරී(වසම් අනුව)
4. විෂය නිළධාරී

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මකවන ප්‍රදේශයන්හි ඉඩම් සැලසුම් ,ඉඩම් අනු බෙදුම් ,ගොඩනැගිලි සැලසුම් ,අනුකූලතා සහතික නිකුත් කිරීම අනුමත කිරීම පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් සිදු කිරීම සුදුසු බවත් ,එම කමිටුව සඳහා සහභාගී වන නිලධාරීන්ට දිනකට කමිටු දීමනාව රු .1000.00 ක මුදල ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

1. ගරු සභාපතිතුමා
2. ලේකම්
3. කාර්මික නිළධාරී(වසම් අනුව)
4. විෂය නිළධාරී

**ඊ - 03**

(2025.08.14 දින ඊ 07 යෝජනාව, සංශෝධිත යෝජනා ලෙස)

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් අඟුරුවැල්ල පිහිටි කඩ කාමර දහයකට අදාලව භුක්ති අයිතිය පිළිබඳව පැවති ගැටලුවට අදාලව දේපලෙහි භුක්ති අයිතිය සම්බන්ධව දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය මඟින් ලිඛිත තහවුරුවක් ලබාගෙන ඇත.එහි සඳහන් වන්නේ අදාල ඉඩම නීත්‍යානුකූලව පවරාගෙන නොමැති බවයි.එම නිසා මෙම කඩ කාමර 10 ට අදාලව බිල් කිරීම් නතර කර ඇති රු .784760.00 ක හිඟ කුලී මුදල හා රු.607650.00 හිඟ දඩ මුදල කපා හැරීම සුදුසු බවට තීරණය කර ,එම කපා හැරීම ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවටත් මහා සභා අනුමැතියට යොමු කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් අඟුරුවැල්ල පිහිටි කඩ කාමර දහයකට අදාලව භුක්ති අයිතිය පිළිබඳව පැවති ගැටලුවට අදාලව දේපලෙහි භුක්ති අයිතිය සම්බන්ධව දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය මඟින් ලිඛිත තහවුරුවක් ලබාගෙන ඇත.එහි සඳහන් වන්නේ අදාල ඉඩම නීත්‍යානුකූලව පවරාගෙන නොමැති බවයි.එම නිසා මෙම කඩ කාමර 10 ට අදාලව බිල් කිරීම් නතර කර ඇති රු .784760.00 ක හිඟ කුලී මුදල හා රු.607650.00 හිඟ දඩ මුදල කපා හැරීම සුදුසු බවත්, එම කපා හැරීම ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඊ - 04**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු ජී.එම්.ඒ පී ගුණතිලක මයාගේ සේවා ගිවිසුම 2026.02.06 දිනෙන් අවසන් වන අතර 2025.12.29 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇත්තේ මෙම ආයතනයේ කොන්දේසි වලට යටත්ව ඉදිරියටත් සේවය කිරීමට එකඟ බැවින් සේවා ගිවිසුම දීර්ඝ කරදෙන ලෙසයි. මේ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වාර්තා කර ඇත්තේ ,මොහුගේ පැමිණීම,වැඩ,හැසිරීම,සතුටුදායක අතර කසල කළමණාකරණ කටයුතු වලට අදාලව ගලපිටමඩ නගරයේ සේවය කරන මොහුගේ සේවය ඉදිරියටත් අවශ්‍ය බැවින් සේවා ගිවිසුම දීර්ඝ කිරීම සුදුසු බවයි.ඒ අනුව ජී.එම්.ඒ පී ගුණතිලක මයාගේ සේවා ගිවිසුම 2026.02.07 දින සිට 2026.05.06 දක්වා කාලයට සේවා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා වන මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.කමල් දේශප්‍රිය මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු ජී.එම්.ඒ පී ගුණතිලක මයාගේ සේවා ගිවිසුම 2026.02.06 දිනෙන් අවසන් වන අතර සේවා ගිවිසුම 2026.02.07 දින සිට 2026.05.06 දක්වා කාලයට සේවා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා වන මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට, ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 05</u>**

අක්කර බදු සත්තේක්ෂණ කටයුතු සඳහා අදාල විෂය නිළධාරී ,ආදායම් පරීක්ෂක හා අදාල වසමේ මන්ත්‍රීවරයාගෙන් යුත් කමිටුවක් පත් කිරීම සඳහා කරණු ලබන යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, අක්කර බදු සත්තේක්ෂණ කටයුතු සඳහා අදාල විෂය නිළධාරී ,ආදායම් පරීක්ෂක හා අදාල වසමේ මන්ත්‍රීවරයාගෙන් යුත් කමිටුවක් පත් කිරීම සුදුසු බවට, ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

පෙ.ව 10.15 පමණ ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා ගරු මහා සභාව වෙත පැමිණෙන ලදි.

**<u>ඊ - 06</u>**

දැනට නිශ්කාර්යව පවතින අංක ZA -5391 දරණ මෝටර් ග්‍රේඩරය දීර්ඝ කාලයක් තිස්සේ භාවිතයට අවස්ථාවක් නොලැබීමෙන් එම යන්ත්‍රය දිරාපත් වීමට ඉඩ ඇති අතර විගණන විමසුම් වලට ද ලක් විය හැක.එබැවින් මෙම යන්ත්‍රය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ වෙන්දේසි කිරීමට හෝ වෙනත් අවශ්‍ය වාහනයක් හෝ යන්ත්‍රයක් සමඟ හුවමාරු කර ගැනීම සඳහා ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා කරණු ලබන යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා විසින් ,මෙම වාහනය දිරාපත් වන නිසාත් නඩත්තු කිරීම ගැටලුවක් වන නිසාත් මේ සම්බන්ධව තීන්දුවක් ගැනීමට යොමු කිරීම ප්‍රශංසා කරන බව පෙන්වා දෙන ලදි.

අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා විසින් මෙම යන්ත්‍රය දී, සී සැමේ කටයුතු කිරීමට හැකියාව ඇති ට්‍රැක්ටර් කීපයක් ගැනීමේ හැකියාව ඇත්නම් ප්‍රදේශයේ ජනතාවටද කුලියට දීමේ හැකියාවක් ඇති බවත් එයින් ජනතාවට සහනයක් සැලසෙන බවත් එසේ නොකරණ අවස්ථා වලදී ට්‍රැක්ටර් එන්ජින් කසල එක් රැස් කිරීමේ කටයුතු සඳහා යොදවා ගැනීමට හැකියාව පවතින බව ද පෙන්වාදෙන ලදි.

අනතුරුව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් මෙම වාහනයෙන් සාර්ථක ප්‍රයෝජනයක් නොමැති නිසා පළමු පියවර ලෙස මෙම යෝජනාව සභා සම්මත කර ගනිමින් පළාත් පාලන කොමසාරිස්තුමා මඟින් ආණ්ඩුකාරතුමිය වෙත යොමු කර මෙය වෙන්දේසි කර අප ආයතනයට ගැලපෙන වාහනයක් ලබා ගැනීමට හැකිද යන්න හෝ හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයකට යා හැකිද යන්න උපදෙස් ලබාගනිමින් අවසන් තීරණයක් වෙත යොමු වීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් මෙම වාහනය වෙන්දේසි කිරීමේ හැකියාවක් අපට නොමැති බවත් ඉහල අවසරයක් ලබා ගතයුතු බව පෙන්වා දෙන ලදි.

අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් මෙම වාහනය භෞතික සම්පතක් වන නිසා හුවමාරු කර ගැනීමකට වඩා වෙන්දේසි කිරීමක් වෙත ගොස් මුදල් උත්පාදනයක් සිදු කරගනිමින් ඒ වෙනුවෙන් උපයෝගීතා වාහන කීපයක් ගැනීමට හැකියාව ඇත්නම් සුදුසු බව පෙන්වා දෙන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා විසින් මේ පිළිබඳව කටයුතු කිරීමට පෙර මු.රෙ පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.එමෙන්ම පොදු 47 පිළිබඳවත් අවධානය යොමු කළ යුතු බව පෙන්වා දෙන අතරම Board of server හි නොමැති දේවල් වෙන්දේසි කිරීම් කළ නොහැකි බවද පෙන්වා දෙන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා විසින් මෙය ආධාරයක් ලෙස ලැබුණු වාහනයක් බවත් එසේනම් එය වෙන්දේසි කිරීම කරන්නේ පළාත් සභාව බවත් ,සී සැමේ ට්‍රැක්ටරයක් ලබා ගැනීමේ යෝජනාවද ඉතා කාලෝචිත අදහසක් වන බවත් කෘෂිකාර්මික කටයුතු සඳහා අයවැයෙන් වෙන් කිරීම් කිරිම සඳහා 2010 චක්‍රලේඛයක් ඇති බවත් ඉමුලාන වාහන අංගනයේ කෙටි අලුත්වැඩියා කිරීම් වලින් ධාවනය කළ හැකි වාහන ඇති බවත් එම ටැක්ටර් පිළිබඳවත් ගරු සභාපතිතුමාගේ අවධානයට යොමු කරන බව පෙන්වා දෙන ලදි.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් මෙය අප ආයතනය වෙත ප්‍රධානයක් වන බවත් සභාවේ කැමැත්ත මත පමණක් කටයුතු කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදි.

එමෙන්ම එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකළ බැවින්,දැනට නිෂ්කාර්යව පවතින ZA5391 දරණ මෝටර් ග්‍රේඩරය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ වෙන්දේසි කිරීමට හෝ වෙනත් අවශ්‍ය වාහනයක් හෝ යන්ත්‍රයක් සමඟ හුවමාරු කර ගැනීම යන තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය පල කරන බවත් ,මේ සම්බන්ධව අදාල උපදෙස් පළාත් පාලන කොමසාරිස් තුමාගෙන් ලබා ගැනීමට කටයුතු කළයුතු බවටත් යටත්ව ,මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 07</u>**

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ ප්‍රකාරව සභාව සතුව තිබු ජංගම වේදිකාව සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ කාර්මික නිළධාරී මහත්මා ප්‍රමුඛ කමිටුවක් මඟින් නිරීක්ෂණය කර ලබා දී ඇති කාර්මික නිළධාරී වාර්තාව මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරන අතර ඒ සඳහා සුදුසු තීරණයක් ගැනීමේ යෝජනාව. (ඇමුණුම් අංක 01)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.වී. රුවිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා විසින්, මෙම යෝජනාවෙහි ඇමුණුම අංක 01 අනුව මේ පිළිබඳව මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණයක් සිදු කර නොමැති බව තමාට හැඟියන බව දක්වා සිටින ලදි.109 යටතේ අවසාන පරීක්ෂණ වාර්තාවක් අනුව ඔවුන් සඳහන් කර ඇත්තේ ඌණතාවයක් බවත් භාණ්ඩාගාර 66 හිත් ඌණතාවයක් ලෙස සඳහන් කර ඇති බවත් භාණ්ඩාගාර 47 හි DISTROI කළ යුතු එකක් ද නැත්නම් වෙන්දේසි කළ යුතු එකක් ද යන්න සඳහන් කර නොමැති

බවත් තමාට හැඟි යන පරිදි මෙහිදී මු.රෙ 104 යටතේ පරීක්ෂනයක් සිදු කර නොමැති බවත් ඒ අනුව එක් අයිතමයක් ලෙස වේදිකාව පවතින බවත් මෙහි කොටස් තිබුනද වේදිකාව එක් අයිතිමයක් බවත් මේය මු.රෙ 771 යටතේ වෙන්දේසි කරනවානම් Board of server හි සඳහන් කිරීමක් තිබෙන බවත් විගණන කමිටු විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කළද මු.රෙ 771 යටතේ නිත්‍යානුකූල භාවයක් නොමැති බවත් Board of server හි ආයතන ප්‍රධානියා නැත්තම්Accounting officer පරීක්ෂණ මන්ඩලයක් පැවැත්විය යුතු බව පැහැදිලිවම පැවතිය යුතු බවත් ඒ නිසා දැනට මෙය මු.රෙ 104 යටතේ පරීක්ෂණයක් පවත්වා නැත්නම් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු යම් තීන්දුවක් ගත යුතුයි බව තමා විසින් අදහස් කරන බවත් නොමැතිව සභාව විසින් සම්මත කිරීම සිදු කලහොත් යම් කිසි දවසක විගණන පරීක්ෂණයක් පැවැත් වූ අවස්ථාවක සභාවේ සියල්ලම අධිභාරයට යටත් වන බවත් ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න ලෙස ඉල්ලා සිටින බවත් දන්වා සිටින ලදි.

අනතුරුව ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා විසින් මෙය සුදුසු තිරණයක් ගැනීම සඳහා යොමු කළ බවත් මෙය තීරණයක් නොගෙන තිබීමත් ගැටලුවක් බවත් මෙලෙස තිබුනහොත් දිරාපත් වන බවත් පරීක්ෂණයක් කර වරදකරුවන් සිටිනම් ඔවුන්ට අදාල කාරණා සිදු විය යුතු බවත් මේ පවතින තත්වය අනුව අපටද වෙන්දේසි කිරිමේ හැතියාවක් නොමැති බවත් පෙන්වා දෙන ලදි.ඒ අනුව නැවත් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදු කර නිවැරදී තීරණයක් ගැනිම සඳහා සභාවේ එකඟතාවයකට පැමිණිය යුතු බව දක්වන ලදි.
අනතුරුව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් මෙම යොජනාව මුදල් රෙගුලාසි වලට අනුව විගණන පරීක්ෂණයක් සිදුකර එම විගණන පරීක්ෂණය අනුව අපවෙත ලබා දෙන තීරණය අනුව අක්‍රමිකතාවයක් සිදු වී ඇතිද අඩුපාඩු පවතිනවාද යන්න විගණන වාර්තාව අනුව බලා ඉන් අනතුරුව මෙය සුදුසු ක්‍රියා මාර්ගයක් අප වෙත ලැබෙන බැවින් ඒ ක්‍රියා මාර්ගයට අනුව කටයුතු කිරීම සුදුසු වන බව තමා විසින් සිතන බව දක්වන ලදි.විගණන විමසුමෙන් පසු නිර්දේශයක් ලැබුනු පසු වෙන්දේසියකට උවද යා හැකි බවද ඒ අනුව කටයුතු කරමුයි යන්න පෙන්වා දෙන ලදි.
,ඒ අනුව එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,ජංගම වේදිකාව සම්බන්ධයෙන් විධිමත් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදු කර ,ජංගම වේදිකාව සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ -08</u>**

( 2025.07.11 දින ඊ 05 යෝජනාව, සංශෝධිත යෝජනා ලෙස )
සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු ඩී.පී.ඒ.යු.කේ.විජයරත්න මයා සේවා අවශ්‍යතාව මත බැකෝ යන්ත්‍රයේ ක්‍රියාකරු ලෙස සේවයේ යොදවාගෙන ඇත.මොහුට දෛනික දීමනාව ලෙස ගෙවීම් කරණුයේ රු.1318.00 කි.වර්තමානයේ මිල ගණන් සලකා බැලීමේදී බැකෝ යන්ත්‍ර ක්‍රියා කරුවන් වෙනුවෙන් මීටර් පැය 01 ක් සඳහා රු .1000.00 ක මුදලක් ගෙවීම් කරන බැවින් 2025.07.11 දිනැති මහා සභාවේ ඊ 05 තීරණය යටතේ සභා සම්මත වී ඇත්තේ බැකෝ යන්ත්‍ර ගාස්තු අයකර කුලියට දීමේ දී ඒ වෙනුවෙන් සේවා සැපයීමේදී සේවා සපයන මීටර් පැය 01 ක් වෙනුවෙන් රු .150.00බැගින් වූ දීමනාවක් සභා අරමුදලින් ඩී.පී.ඒ.යු.කේ.විජයරත්න මයා වෙත ගෙවීම් කිරීම සුදුසු බවය.නමුත් බැකෝ යන්ත්‍ර ක්‍රියා කරුවකුගේ රාජකාරී ස්වභාවය හා වර්තමාන මිල ගණන් සලකා බැලීමේදී මෙන්ම ඩී.පී.ඒ.යු.කේ.විජයරත්න මයා විසින් සභාව මඟින් ගාස්තු අය කිරීමකින් තොරව සිදු කරන රාජකාරී වලදීද බැකෝ යන්ත්‍රයේ සේවය කරන බැවින් ඔහුට ඒ වෙනුවෙන් සාධාරණ මුදලක් ගෙවීම් කළ යුතු නිසා බැකෝ යන්ත්‍රයේ සේවය කරන සෑම මීටර් පැය 01 ක් වෙනුවෙන්ම ඉහත රියදුරුට රු .150.00ක දීමනාවක් ගෙවීම සුදුසු වේ .ඒ අනුව මේ සම්බන්ධයෙන් මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා සංශෝධිත යෝජනාවක් ලෙස ඉදිරිපත් කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ( 2025.07.11 දින ඊ 05 යෝජනාව, සංශෝධිත යෝජනා ලෙස )

සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු ඩී.පී.ඒ.යූ.කේ.විජයරත්න මයා සේවා අවශ්‍යතාව මත බැකෝ යන්ත්‍රයේ ක්‍රියාකරු ලෙස සේවයේ යොදවාගෙන ඇත.මොහුට දෛනික දීමනාව ලෙස ගෙවීම් කරණුයේ රු.1318.00 කි.වර්තමානයේ මිල ගණන් සලකා බැලීමේදී බැකෝ යන්ත්‍ර ක්‍රියා කරුවන් වෙනුවෙන් මීටර් පැය 01 ක් සඳහා රු .1000.00 ක මුදලක් ගෙවීම් කරන බැවින් 2025.07.11 දිනැති මහා සභාවේ ඊ 05 තීරණය යටතේ සභා සම්මත වී ඇත්තේ බැකෝ යන්ත්‍ර ගාස්තු අයකර කුලියට දීමේ දී ඒ වෙනුවෙන් සේවා සැපයීමේදී සේවා සපයන මීටර් පැය 01 ක් වෙනුවෙන් රු .150.00බැගින් වූ දීමනාවක් සහා අරමුදලින් ඩී.පී.ඒ.යූ.කේ.විජයරත්න මයා වෙත ගෙවීම් කිරීම සුදුසු බවය.නමුත් බැකෝ යන්ත්‍ර ක්‍රියා කරුවකුගේ රාජකාරී ස්වභාවය හා වර්තමාන මිල ගණන් සලකා බැලීමේදී මෙන්ම ඩී.පී.ඒ.යූ.කේ.විජයරත්න මයා විසින් සභාව මඟින් ගාස්තු අය කිරීමකින් තොරව සිදු කරන රාජකාරී වලදීද බැකෝ යන්ත්‍රයේ සේවය කරන බැවින් ඔහුට ඒ වෙනුවෙන් සාධාරණ මුදලක් ගෙවීම් කළ යුතු නිසා බැකෝ යන්ත්‍රයේ සේවය කරන සෑම මීටර් පැය 01 ක් වෙනුවෙන්ම ඉහත රියදුරුට රු .150.00ක දීමනාවක් ගෙවීම සුදුසු වේ .ඒ අනුව මේ සම්බන්ධයෙන් මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ-09</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් රන්වැලි සංකීර්ණයට අයත් කඩ කාමර 15 ක් සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇත.එම තක්සේරුව ක්‍රියාත්මක කරන්නේ කුමන මාසයේ සිටද යන්නත්,එම තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනිමට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා විසින්ම මේ පිළිබඳව පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා විසින් මෙය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් බවත් 2025.11.27 මේ වාර්තාව පැමිණ ඇති බවත් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර සඳහා තක්සේරු වාර්තාව ලබා ගැනීම සම්බන්ධව ලෙස ලිපිය ලැබී ඇති බවද රන්වැලි වෙළඳ සංකීර්ණයේ තක්සේරු වාර්තාවක් අප වෙත ලැබී ඇති බවත් මෙහි
මාසික කුලිය

01 කඩ කාමරය රු .7500.00
02 කඩ කාමරය රු .10,000.00
03කඩ කාමරය රු .10,000.00
04 කඩ කාමරය රු .10,000.00
05 කඩ කාමරය රු.4500.00
06 කඩ කාමරය රු .6500.00
07 කඩ කාමරය රු .6500.00
08 කඩ කාමරය රු.6500.00
09 කඩ කාමරය රු .6500.00
10 කඩ කාමරය රු .6500.00
11 කඩ කාමරය රු.3500.00
12 කඩ කාමරය රු.5600.00
13 කඩ කාමරය රු.7000.00
14 කඩ කාමරය රු.7000.00
15 කඩ කාමරය රු.7000.00

මේ ආකාරයට තක්සේරු වාර්තාව එවා ඇතිබව දක්වන ලදි.වෙළඳ සංකීර්ණයේ මැතකදී එවා ඇති තක්සේරුව මෙය බවත් මෙය ක්‍රියාත්මක කරන්නේ කවදාද කියා මෙහිදී අසන බවත් පෙන්වා දෙන ලදි.

අනතුරුව මේ සම්බන්ධව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් මෙම කඩ කාමර ගං වතුරට යට වූ බවද ඒත් එක්කම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව අනුව තක්සේරු මුදලත් වැඩි වී ඇති බවත් අය කිරීම් කළ යුතු වුවත් හානියකට පත් වී ඇති බවද ඒ පිළිබඳව සලකා බලා මාසයක් පමණ සහන කාලයක් ලබා දෙමින් මෙය ක්‍රියාත්මක කිරීම සුදුසු වන බව පෙන්වා දෙන ලදි.විගණනය වීම පිළිබඳවද සලකා බලමින් පෙබරවාරි මාසය දක්වා වත් සහනයක් දෙමින් කටයුතු කිරීම සුදුසු වන බව පෙන්වා දෙන ලදි.

එමෙන්ම එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකළ බැවින්,ඒ අනුව ජනවාරි මාසය නිදහස් කිරීමක් සිදු කර පෙබරවාරි මස පළවන දින සිට

තක්සේරුව ක්‍රි යාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

න්‍යාය පත්‍රයට අනුව ඉදිරිපත් වු යෝජනා අවසන් වන අතරම හදිසි යෝජනා ඇති බැවින් එම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා යෝජනා කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදි.
ඒ අනුව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් අද දිනට ලැබී ඇති හදිසි යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර ,එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව හදිසි යෝජනා ලෙස

01

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතාගේ යෝජනා,</u>

<u>ඊ-10</u>

2025.10.13 දින ගරු මහා සභාවට ඊ 08 දරණ අංකය යටතේ ඉදිරිපත් කරන ලද 2026 වර්ෂය සඳහා බදු පැනවීම පිළිබඳ යෝජනාව එදින ගරු මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.එම බදු පැනවීමට අදාල විස්තරය තාක්ෂණික මුද්‍රණ දෝෂයක් හේතුවෙන් සහා වාර්තාවේ ඇතුලත්ව නොතිබුණි.ඒ අනුව එම යෝජනාවට අදාල විස්තරය වාර්තාගත කිරීම සුදුසු බවට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.10.13 දින ගරු මහා සභාවට ඊ 08 දරණ අංකය යටතේ ඉදිරිපත් කරන ලද 2026 වර්ෂය සඳහා බදු සහ ගාස්තු පැනවීම පිළිබඳ යෝජනාව එදින ගරු මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.එම බදු පැනවීමට අදාල විස්තරය පහත සඳහන් පරිදි වාර්තාගත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව</u>

<u>**2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**</u>

1987අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ / ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චිත දේපලක වාර්ෂික වටිනාකම 2024 වර්ෂයේ තක්සේරු කටයුතු ආරම්භ කරන ලද නව වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනයේ වාර්ෂික වටිනාකම 2026.01.01 දින 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට හා නව වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය 2026.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටද ,

(ආ) 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල නාගරික බල ප්‍රදේශයේ අංක 01 සිට අංක 07 දක්වා යන කොට්ඨාශ වල සෑම නිශ්චිත දේපලක් මත සියයට හතක (7%)ක වරිපනම් ප්‍රතිශතයක්ද, ගෝනගල්දෙණිය(කොට්ඨාශ අංක 08) අම්තිරිගල (කොට්ඨාශ අංක 09) ගලපිටමඩ(කොට්ඨාශ අංක 10) කන්නත්තොට(කොට්ඨාශ අංක 11) යන බල ප්‍රදේශ වල පිහිටි සෑම නිශ්චිත දේපලක් මතම සියයට හතරක (4%) වරිපනම් ප්‍රතිශතයක් අය කිරීමටද

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව - අය කරන වරිපනම් ප්‍රතිශත

| කොට්ඨාශය | පාර | ඒකක ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|
| කොට්ඨාශය අංක 01 | පහළමුල්ල පාර දකුණ (අංක 12 සිට 118) | 54 | 7% |
| | පහළමුල්ල පාර වම (අංක 11 සිට 131) | 138 | 7% |
| | අවිස්සාවේල්ල දකුණ (අංක 342A සිට 690/56) | 372 | 7% |
| මුළු ඒකක ගණන | | **564** | |
| කොට්ඨාශය අංක 02 | තොටුපොළ දකුණ (අංක 2 සිට 10) | 7 | 7% |
| | තොටුපොළ වම (අංක 19 සිට 27) | 4 | 7% |
| | අවිස්සාවේල්ල දකුණ (අංක 34 සිට 690/56) | 452 | 7% |
| | වේයන්ගොඩ වම (අංක 25 සිට 71) | 16 | 7% |
| මුළු ඒකක ගණන | | **479** | |
| කොට්ඨාශය අංක 03 | ඇරැපොලමුල්ල පාර දකුණ (අංක 14) | 1 | 7% |
| | ඇරැපොලමුල්ල පාර වම (අංක 5 සිට 19) | 7 | 7% |
| | මොරාවත්ත පාර දකුණ (අංක 2 සිට 36/5) | 18 | 7% |
| | මොරාවත්ත පාර වම (අංක 3 සිට 25) | 11 | 7% |
| | වේයන්ගොඩ පාර දකුණ (අංක 82 සිට 300/1) | 129 | 7% |
| | වේයන්ගොඩ පාර (වම) (අංක 101 සිට 305/1) | 72 | 7% |
| මුළු ඒකක ගණන | | **238** | |
| කොට්ඨාශය අංක 04 | වේයන්ගොඩ පාර දකුණ (අංක 2 සිට 50) | 43 | 7% |
| | වරකාපොළ දකුණ (අංක 4 සිට 220) | 135 | 7% |
| | වරකාපොළ වම(අංක 3 සිට 245) | 170 | 7% |
| | කෑගල්ල පාර වම (අංක 3 සිට 287B) | 277 | 7% |
| මුළු ඒකක ගණන | | **625** | |
| කොට්ඨාශය අංක 05 | කෑගල්ල පාර දකුණ(අංක 52 සිට 368/51A) | 392 | 7% |
| මුළු ඒකක ගණන | | **392** | |

| | | | |
|---|---|---|---|
| කොට්ඨාශය අංක 06 | අවිස්සාවේල්ල පාර වම (අංක 43A සිට | 354 | 7% |

| | | | |
|---|---|---|---|
| | 413/13) | | |
| | කැගල්ල පාර (දකුණ (අංක 16 සිට 48) | 51 | 7% |
| | ගෙස්ට් හවුස් පාර (දකුණ) (අංක 20 සිට 22) | 3 | 7% |
| | ගෙස්ට් හවුස් පාර (වම (අංක 3සිට 9) | 3 | 7% |
| | පොත්තෙකුඹුර පාර (දකුණ (අංක 60 සිට 39) | 17 | 7% |
| | පොත්තෙකුඹුර පාර (වම (අංක 3සිට 25) | 11 | 7% |
| මුළු ඒකක ගණන | | **439** | |
| කොට්ඨාශය අංක 07 | අවිස්සාවේල්ල පාර (වම(අංක 413/14සිට 679/1/1) | 202 | 7% |
| | වැන්දල පාර (දකුණ) - 7 (අංක 4සිට 52) | 4 | 7% |
| | යටියන්තොට පාර (දකුණ)(අංක 18 සිට 50) | 15 | 7% |
| | යටියන්තොට පාර (වම (අංක 3 සිට 45) | 8 | 7% |
| මුළු ඒකක ගණන | | **229** | |
| කොට්ඨාශය අංක 08 | පාසල් මාවත (දකුණ) (අංක 2 සිට 10) | 3 | 4% |
| | පාසල් මාවත - වම) (අංක 1 සිට 17) | 6 | 4% |
| | බස්නාගොඩ පාර (දකුණ) (අංක 2 සිට 7) | 25 | 4% |
| | බස්නාගොඩ පාර (වම (අංක 1 සිට 75) | 26 | 4% |
| | රුවන්වැල්ල පාර (දකුණ) (අංක 6 සිට 82) | 29 | 4% |
| | රුවන්වැල්ල පාර (වම) (අංක 1 සිට 55 1/1 ) | 29 | 4% |
| | වේයන්ගොඩ පාර (දකුණ)(අංක 2 සිට 96) | 38 | 4% |
| | වේයන්ගොඩ පාර (වම)(අංක 5 සිට 73) | 29 | 4% |
| මුළු ඒකක ගණන | | **185** | |
| කොට්ඨාශය අංක 09 | ගුරුගල්ල පාර දකුණ (අංක 2 සිට 26) | 26 | 4% |
| | ගුරුගල්ල පාර වම (අංක 1 සිට 79/1) | 31 | 4% |
| | හිස්සැල්ල පාර දකුණ (අංක 10 සිට 12/2) | 5 | 4% |
| | හිස්සැල්ල වම (අංක 1 සිට 17) | 6 | 4% |
| | බටුවිට පාර දකුණ (අංක2 සිට 22) | 4 | 4% |
| | බටුවිට පාර වම (අංක 1 සිට 29) | 12 | 4% |
| මුළු ඒකක ගණන | | **84** | |
| කොට්ඨාශය අංක 10 | අඟුරුවැල්ල වම (අංක 17 සිට 77) | 28 | 4% |

| | | | |
|---|---|---|---|
| | අඟුරුවැල්ල දකුණ (අංක 2 සිට 86) | 32 | 4% |
| | දැදිගම පාර දකුණ (අංක 4 සිට 22 1/1) | 11 | 4% |
| | දැදිගම පාර වම (අංක 3 සිට 17) | 1 | 4% |
| | වරකපොල පාර දකුණ (අංක 12 සිට 114) | 46 | 4% |
| | වරකාපොල පාර වම (අංක 1 සිට 127) | 68 | 4% |
| මුළු ඒකක ගණන | | **186** | |
| කොට්ඨාශය අංක 11 | අවිස්සාවේල්ල දකුණ (අංක 10 සිට 240) | 115 | 4% |
| | අවිස්සාවේල්ල වම (අංක 1 සිට 189) | 121 | 4% |
| | කෑගල්ල දකුණ (අංක 2 සිට 198) | 145 | 4% |
| | කෑගල්ල වම (අංක 1 සිට 227) | 150 | 4% |
| | බුලත්කොහුපිටිය පාර (දකුණ)(අංක 2 සිට 32) | 17 | 4% |
| | බුලත්කොහුපිටිය පාර (වම (අංක 3සිට 31) | 16 | 4% |
| | පරණවත්ත පාර (දකුණ)(අංක 2සිට 10) | 8 | 4% |
| | පරණවත්ත පාර (වම)(අංක 5සිට 17) | 4 | 4% |
| | පොල්කටුවංගුව පාර (දකුණ)(අංක 8සිට 18) | 3 | 4% |
| | පොල්කටුවංගුව පාර (වම)(අංක 11සිට 25) | 6 | 4% |
| මුළු ඒකක ගණන | | **585** | |

(ඇ)1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වාර් ෂික වරිපනම් බදු මුදල අදාල වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර් තු 04 තුලදී සමාන වාරික වලින් ප්‍රාදේශීය සභාවට ගෙවීමටද 2025.09.11 දින පැවැත්වූ ගරු මහ සභාව තීරණය කරන ලදී.(ඊ 5 යෝජනාව).

(ඇ) 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (7) උප වගන්තිය ප්‍රකාරව අදාල වර් ෂය සඳහා වන වරිපනම් බදු මුදල ජනවාරි මස 31 වන දිනට පෙර ගෙවනු ලැබුවහොත් සම්පූර් ණ වරිපනම් බදු මුදලින් සියයට දහයක (10%) වට්ටමක් හා අදාළ වරිපනම් මුදල ඒ ඒ කාර් තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් කාර්තුවේ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද දෙනු ලැබේ.

<u>රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව</u>

**<u>2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2026 වර්ෂයේදී බලාත්මක වූ සත්යේක්ෂණය 2026 වර් ෂයේ සත්යේක්ෂණය ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර් යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර 05 ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ අක්කර බද්දක් 2026 වර් ෂයේ පනවා අය කිරීමට සහ,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත බද්ද 2026 වර් ෂයේ මාර් තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර් තු හතර තුලදී සමාන වාරික හතරකින් (04) ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් වන තැනැත්තෙකුට විධාන කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(ඇ) 2026 වර් ෂය සඳහා වන සම්පූර් ණ අක්කර බද්ද 2026 වර් ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර් යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර් ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර් තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර් තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

## ඉහත කී උපලේඛනය

| කාර් තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු වන කාර් තුව | 2026.01.01-2026.03.31 | 2026.01.31 |
| දෙවන කාර් තුව | 2026.04.01-2026.06.30 | 2026.04.30 |
| තුන්වන කාර් තුව | 2026.07.01-2026.09.30 | 2026.07.30 |
| හතරවන කාර් තුව | 2026.10.01-2026.12.31 | 2026.10.31 |

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
## 2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවියයුතු එකී පනතේ 148 වන වගන්ති සහ 4 වන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර් ෂයේදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එකී උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර් ෂයේදී පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

**ඉහත කී උපලේඛනය**

| I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|
| | රු. ශත |
| මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, | |

| | |
|---|---|
| මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, | රු.25.00 |
| බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන | |
| සෑම වාහනයක් සඳහා කාර් තුවකට | |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරයක් | |
| හෝ කරත්තයක් සඳහා :- | |
| (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) වෙළඳ කාර් යය නොවන කාර් යය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| සෑම ඇතකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර් යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර් යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

(මේ උපලේඛනයේ "වෙළඳ කාර් යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර් මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

<u>රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව</u>

**<u>2026 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149වන වගන්තිය සමඟ කියවියයුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කර් මාන්තයක් 2026 වර් ෂයේදී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර් මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර් ෂික වටිනාකම II වන තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුලත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළයුතු යැයි රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර් යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර් ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර් ෂය සඳහා නියම විය යුතු බවටත් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**<u>උප ලේඛනය - I</u>**

**<u>අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් -</u>**

| අනු අංකය | I තීරුව<br><br>බලය දෙනු ලබන කාර්යය | II තීරුව<br><br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. **750.00** නොඉක්මවන අවස්ථාවක | රු. **751.00** ඉක්මවන එහෙත් රු.**1500.00** නොඉක්මවන අවස්ථාවක | රු. **1501.00** ඉක්මවන අවස්ථාවක |
| 1. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ, සේවා කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | බැටරි චාර් ජ් කිරීමේ මධ්‍යස්ථානය | 500.00 | 750.00 | 1000.00 |
| 3. | ෂැම්පු/ සුවඳ විලවුන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ස්වර් ණාභරණ නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 5. | ඔර් ලෝසු අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ගුවන් විදුලි යන්ත්‍ර/ රූපවාහිනි හා විදුලි උපකරණ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 7 | කුකුළු හා ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | එළවළු හා පලතුරු අලෙවිය | | | |
| 9 | විජලනය කරන ලද පලතුරු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 10. | පුපුරණ ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ගෑස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | සබන් නිෂ්පාදනය/ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 13. | පින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | තේ කොළ නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 15. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 17. | විද්‍යුත් ලෝහ ආලේපනය | 500.00 | 750.00 | 1000.00 |
| 18. | ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| **19.** | **දැව කැබලි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **20** | **යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| **21.** | **යාන්ත්‍රික ලී මෝලක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **22.** | **මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **23.** | **ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **24.** | **ලේත්/වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **25.** | **මුද්‍රණාලයක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **26.** | **ඇඹරුම්හලක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **27** | **කම්මලක් පවත්වාගෙන යාම** | 500.00 | 750.00 | 1000.00 |
| **28.** | **සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය කිරීම** | 500.00 | 750.00 | 1000.00 |
| 29. | පාපැදි,යතුරු පැදි, ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | වාහන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 31. | බ්‍රේක් ලයිනර් අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 32. | ඩීසල් පොම්ප අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 33. | ප්‍රචාරක දැන්වීම් පුවරු හා වෙනත් දැන්වීම් ආදිය මුද්‍රණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 35. | පෞද්ගලික දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | අත් යන්ත්‍ර මඟින් රබර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 38. | පොල් තෙල් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 40. | කලුගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | වාහන පින්තාරු කිරීම හා ලොරි බොඩි ගැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 42. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43. | සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44. | කෘෂි රසායන හා පොහොර නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 45. | හුණු ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 46 | තේ කර් මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 47. | රබර් කර් මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 48. | ඇඟලුම් කර් මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 49. | සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 50. | බිම්මල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 51. | රේඩියේටර් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 52. | කොළ කැඳ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 53. | පානීය ජලය බෝතල් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 54. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 55 | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56. | උත්සව අවස්ථාවන් සඳහා ආහාරපාන සැපයීම | 500.00 | 750.00 | 1000.00 |
| 57. | හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 58. | ලෝහ භාණ්ඩ නිෂ්පාදනය හා එකලස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 59. | පොටි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 60. | තුනී ලෑලි / ප්ලයිවුඩ් ලෑලි නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 61. | ගම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 62. | වැලි ගොඩ දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 63. | පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 64. | කරවල නිශ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 65. | මස් ප්‍රවාහනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 66. | ආයුර් වේද ඖෂධ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 67. | පටක රෝපණ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 68. | ටයිල් ග්‍රවුට් සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 69. | ටයිල් කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 70. | කර් ටන් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 71. | කුළුබඩු නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 72. | වයරින් කිරීම හා අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 73. | වීදුරු බෝතල් පිරිසිදු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 74. | ඉවතලන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 75. | විද්‍යාගාර උපකරණ රසායනික ද්‍රාවණ සහ උපාංග ආදිය අලෙවිය හා බෙදාහැරීම | 500.00 | 750.00 | 1000.00 |

**උප ලේඛනය- II**

**වෙනත් ව්‍යාපාර හෝ කර්මාන්ත 2026 වර්ෂය**

| අනු අංකය | I තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. **750.00** නොඉක්මවන අවස්ථාවක | රු. **751.00** ඉක්මවන එහෙත් රු.**1500.00** නොඉක්මවන අවස්ථාවක | රු. **1501.00** ඉක්මවන අවස්ථාවක |
| 1. | තේ කඩ /කෝපි කඩ,ආපන ශාලා ,බත් කඩ පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | බේකරියක් පවත්වාගෙන යාම/ කේක් හා රසකැවිලි නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ආහාර වර්ග විකිණීම/බයිට් වර්ග /ෆෘට් සැලඩ්/ක්ෂණික ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 5. | සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 6. | අයිස් ක්‍රීම් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 7. | මාළු වෙළඳම හා ශීතකල මාළු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 8. | මස් වෙළඳම හා ශීතකල මස් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 9. | ලැගුම්හලක් හා රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ගව පට්ටියක් හා කිරි අලෙවිය/ කිරිහලක් පවත්වාගෙන යාම/ කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 12. | සාතන මඩු පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | සංචාරක වෙළදාම | 500.00 | 750.00 | 1000.00 |

**<u>රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව</u>**

**<u>2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර,

(අ) රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර් මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර් මාන්ත බද්දක් 2026 වර් ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

<u>උප ලේඛනය</u>

| අනු අංකය | I තීරුව<br><br>කර්මාන්තය | II තීරුව<br><br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | **රු.750.00** නොඉක්මවන අවස්ථාවක | **රු.751.00** ඉක්මවන එහෙත් **රු.1500.00** නොඉක්මවන අවස්ථාවක | **රු.1501.00** ඉක්මවන අවස්ථාවක |
| 1. | කැටයම් කැපීමේ කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 2. | කොසු, ඉදල්, පාපිසි නිෂ්පාදනය කිරීමේ<br><br>කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 3. | යාන්ත්‍රික රෙදි විවීම හා අත් යන්ත්‍ර මඟින් රෙදි විවීමේ කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 4. | දේශීය අමුද්‍රව්‍ය යොදා ගෙන අත්කම් නිර් මාණ නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 5. | රෙදිපිළි පින්තාරු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | කිතුල් ආශ්‍රිත නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | කිතුල් ලී , පොල්කටු ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 8. | පාවහන් නිපදවීම හා අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 9. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | මෙට්ට නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11. | හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12. | යාන්ත්‍රික නොවන වඩු කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 13. | ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 14. | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | වාස්තු කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 17. | රබර් වේලන දුම්ගෙයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | සත්ව ආහාර නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | ලියුම් කවර හා වෙනත් කවර නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 21. | යන්ත්‍රානුසාරයෙන් බීරළු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 22. | නළ ලිං සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | බෑග් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | මදුරු දැල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 25. | කඩදාසි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 26. | කලර් සිමෙන්ති සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | පහන් තිර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 28. | ඇලුමිනියම් / ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 29. | පෙනේර, බාල්දි , කිරිගොටු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

**<u>රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව</u>**

**<u>2026 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම</u>.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ ,

අ) (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තුවකට හෝ එකී පනතේ 150 වන වගන්තිය ප්‍රකාරව කර් මාන්ත බද්දට යටත් නොවන්නාවූ යම් ව්‍යාපාරයක් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2026 වර් ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2025 වර් ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර් ෂය සඳහා නියම වියයුතු බවටත්,

(ආ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2026 අප්‍රේල් මස 01 දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**ඉහත කී උපලේඛණය**

| I තීරුව<br><br>2025 වර් ෂයේ දී ව්‍යාපාරයේ ආදායම | II තීරුව<br><br>රු. ශත |
|---|---|
| රු.6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු.6,000ඉක්මවන එහෙත් රු.12,000 නොඉක්මවන අවස්ථාවක | රු.90.00 |
| රු.12,000 ඉක්මවන නමුත් රු.18,750 නොඉක්මවන අවස්ථාවක | රු.180.00 |
| රු.18,750 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක | රු.360.00 |
| රු.75,000 ඉක්මවන නමුත් රු.150,000 නොඉක්මවන අවස්ථාවක | රු.1,200.00 |
| රු.150,000 ඉක්මවන අවස්ථාවක | රු.3,000.00 |

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර් ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 0.5% වන බද්දක් 2026 වර් ෂය සඳහා පනවා අයකළයුතු බවටත්, එම බද්දේ කාර් යය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153(1)(ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩම ගොඩනැගිලි වලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර් ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 වියයුතු යැයි නියම කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂය සඳහා පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු අය කිරීම**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2026 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු පැනවීමට යෝජනා කරන්නීය.

| | | රු.ශත |
|---|---|---|
| 01. වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික පත්‍ර ගාස්තු | | 1,500.00 |
| 02. වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික අයදුම් පත්‍ර ගාස්තු | | 200.00 |
| 03. අනුකූලතා සහතික ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කිරීම | | 200.00 |
| 04. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේඉල්ලුම්පත්‍ර ගාස්තු | | |
| | නාගරික | 1,200.00 |
| | නාගරික නොවන | 750.00 |
| 05. ඉඩමේ සැලස්ම අනුමත කිරීමේ අයදුම් පත්‍ර ගාස්තු | | |
| | නාගරික | 1,200.00 |
| | නාගරික නොවන | 500.00 |
| 06. අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු | | |
| | බලපත්‍ර ලබා ගත යුතු ගස් වර්ග සඳහා | 2,000.00 |
| | බලපත්‍ර ලබාගැනීම අවශ්‍යා නොවන ගස් සඳහා | 1,000.00 |

07.වරිපනම් ලේඛණයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව 200.00

08. වරිපනම් වාර් තා නිකුත් කිරීමේ ගාස්තුව 500.00

09. වරිපනම් බදු ගෙවන බවට සහතික නිකුත් කිරීම සඳහා ගාස්තුව 500.00

10.නව වරිපනම් අංක නිකුත් කිරීමේ අයදුම් පත්‍ර ගාස්තු 200.00

11.නව වරිපනම් අංක නිකුත් කිරීමේ ගාස්තුව 1,000.00

12.වරිපනම් ලේඛනයේ නම් සංශෝධනයට තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමේ ගාස්තු 1,000.00

13.ජාතික ගොඩනැගිලි පර් යේෂණ සංවිධානයේ නිර් දේශය ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු 100.00

(බී.ඒ. අයදුපත්‍රය)

14.යන්ත්‍ර සූත්‍ර හා වාහන කුලියට දීම

- ❖ කම්පන තලනය (ලෙලෙන තලනය ටොන් 1 ½ ) පැය 8 ක දිනකට

  (වාහන කුලී ඉන්ධන සේවා වැටුප් සමඟ) 11,000.00

- ❖ බැකෝ ලෝඩරය (JCB) මීටර් පැය එකක ගාස්තුව 5,000.00

**(ඉල්ලුම් කරනු ලබන කාලය පැය 2 ක් හෝ 2 ට වඩා අඩුවන අවශ්‍යතාවේ දී**

**පළමු කිලෝ මීටරය සඳහා රු.750.00 ක් ද එතැන් සිට වැඩිවන සෑම**

**කිලෝ මීටරයක් සඳහාම රු.500.00 බැගින් ද ප්‍රවාහන ගාස්තුවක් අය කෙරේ)**

(පැය දෙකකට වඩා වැඩිවන අවශ්‍යතාවලදී ප්‍රවාහන ගාස්තුවක් අය කරනු නොලැබේ)

- ❖ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලී පදනම මත ලබා දීමේදි මීටර් පැය 06 කට අඩු

ඕනෑම කාලසීමාවක් සඳහා (මීටර් පැය 06 දක්වා ) ගාස්තුව පැයකට 6,500.00

(පැය 06 ක් සඳහා(6,500.00x6) රු.39000.00 ක් වේ. )

පැය 06 කට වැඩිවන අවස්ථාවලදී මීටර් පැයකට ගාස්තුව රු.6000.00 ක් වේ.

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉල්ලුම් කරන උපරිම දින 10 ක් සඳහා එම ඉල්ලුම් කරන දිනට අමතරව එක් දිනකට ගාස්තුව ගෙවිය යුතුය.

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉල්ලුම් කරනු ලබන්නේ දින 10කට වඩා වැඩි කාලයක් සඳහා නම් ගිවිසුම් ගත විය යුතුය.

- ❖ ජලබවුසරය (ලොකු) ලීටර් 6000 (ජලය රහිතව)

  (රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ) 8,000.00

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත 10,000.00

ප්‍රවාහන ගාස්තු වශයෙන් කි.මී. 1 සඳහා යාමට සහ ඒමට රු. 350.00 ක ගාස්තුවක් අය කෙරේ.

රඳවා තබා ගන්නවානම් රඳවා තබා ගන්නා එක් පැයකට රු.1,500.00 බැගින් අයකෙරේ.

- ❖ ගලිබවුසරය

01. රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව තුළ 8,500.00

02. රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාවෙන් පිටත හා

බල ප්‍රදේශයෙන් පිටත 10,000.00

03. ප්‍රවාහන ගාස්තු කි. මී.01 යාමට හා ඒමට සඳහා 200.00

04.ඉඳල්පොල මලාපවාහන පද්ධතියට බැහැර කිරීම සඳහා ගාස්තුව

බල ප්‍රදේශයෙන් පිටත 2,000.00

බල ප්‍රදේශය තුළ මුදල් අය නොකෙරේ.

රාජ්‍ය ආයතන සඳහා 2,000.00

රාජ්‍ය නොවන ආයතන සඳහා 3,500.00

බල ප්‍රදේශය තුළ මුදල් අය නොකෙරේ.

සේවා ගාස්තු 1,000.00

- ටිපර් රථය සඳහා ගාස්තුව

කියුබ් 03ට අඩු කි.මී.15ට ඕනෑම දුරක් සඳහා 9,000.00

ඊට වැඩිවන සෑම කි.මී. 1 සඳහා යාමට හා ඒමට රු.400.00 කි.

- ප්ලාස්ටික් පුටු - එක් පුටුවක් 20.00

- (නැතිවීමකදී පුටුවක මිල අය කෙරේ)

- කොඩි කණු - එක් කොඩි කණුවක් සඳහා - රු.30.00 කි

- (කොඩි කණු ලබා ගැනීමේදී රු. 3,000.00 ක තැන්පතු මුදලක් ගෙවිය යුතුය.)

- ( පූජනිය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර, නැතිවුවහොත් කණුවක තත්කාලීන වෙළඳ වටිනාකම හා ඉන් 5% ක් අයකෙරේ.)

- බෞද්ධ කොඩි - එක් බෞද්ධ කොඩියක් සඳහා - රු 20.00 කි

- (පූජනිය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැතිවිමකදී හෝ පලුදු වීමකදී කොඩියේ වටිනාකම ගෙවිය යුතුය.)

- ජාතික කොඩි -(එක් ජාතික කොඩියක් සඳහා - රු 20.00 කි)

- (පූජනිය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැතිවිමකදී හෝ පලුදු වීමකදී කොඩියේ වටිනාකම ගෙවිය යුතුය.)

- ෆ්ලෑෂ් ලයිට් එකක් - රු 1,000.00 කි.

(ෆ්ලෑෂ් ලයිට් සඳහා දින තුනකට රු. 1,000.00 ක් බැගින් ද, වැඩිවන සෑම දිනක් සඳහා රු. 200.00 ක් බැගින් අයකෙරේ. බල ප්‍රදේශය තුල මළගෙවල් හා ආගමික ස්ථාන වලට නොමිලේ සැපයේ)

15. 2026 වර් ෂය සඳහා රුවන්වැල්ල ප්‍රාදේශීය සභා නාගරික නොවන ප්‍රදේශවල මිනින්දෝරු සැලසුම අනුමත කිරීම, කට්ටි සැලසුම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම අනුමත කිරීම, කාලය දීර් ස කිරීම සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකල යුතු ගාස්තු | |
|---|---|---|
| | ඉඩමේ ප්‍රමාණය වර්ග මීටර | පෙරසැරි ගාස්තු |
| 1. ඉඩම් අනු බෙදුම් සඳහා | ව.මී.150 - ව.මී.300<br>ව.මී.301 - ව.මී.600<br>ව.මී.601 - ව.මී.900<br>ව.මී.900 වැඩි | රු.1000.00<br>රු.800.00<br>රු.650.00<br>රු.500.00 |

| | | |
|---|---|---|
| 2.ඉඩම් අනු කොටස් වලට බෙදීම | ව.මී.150 -ව.මී.300<br>ව.මී.301 -ව.මී.600<br>ව.මී.601 -ව.මී.900<br>ව.මී.900 ට වැඩි | කැබලි 1ක් සඳහා -රු.1,250.00<br>කැබලි 1ක් සඳහා -රු.1000.00<br>කැබලි 1ක් සඳහා -රු.800.00<br>කැබලි 1 ක් සඳහා -රු.700.00 |
| 3.මායිම් තාප්ප /රුඳවුම් බැම් ඉදිකිරීම | දික් මීටර් 1ක් සඳහා | රු.100.00 |
| 4.සංනිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදි කිරීම | | රු.40000.00 |
| 5.ඉන්ධන පිරවුම්හල්/වාහන සේවා ස්ථාන/දුම් පරීක්ෂා කරන ස්ථාන | ව.මී.1ක් සඳහා | රු.100.00 |
| 6.දැන්වීම් පුවරු | i.ඩිජිටල් දැන්වීම් පුවරු(ව.මී.1ට) | රු.2,500.00 |
| | ii.ඩජිටල් නොවන දැන්වීම පුවරු (ව.මී.1 ට) | රු.1,500.00 |
| | iii.නාම පුවරු(ව.මී.1ට) | රු. 500.00 |

| | | | |
|---|---|---|---|
| | iv.මාර්ගයකට ඉහලින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු(Gertries) ව.මී.1 ට | රු.1000.00 | |
| 7.කසල බැහැර කිරීමේ අංගන/තාවකාලික රුස්කර තබන ස්ථාන/කොම්පෝස්ට් අංගන/සෞඛ්‍යාරක්ෂිතව කසල යොදා ඉඩම් ගොඩකිරීම | හෙක්ටයාර් 1 දක්වා<br><br>හෙක්ටයාර් 1ට වැඩි | රු.25,000.00<br><br>රු. 250,000.00 වැඩිවන සෑම හෙක්ටයාර් 1 කට හෝ ඉන් කොටසක් සඳහා රු.5,000.00 බැගින් | |
| 8.නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි | ගෙබිම් ප්‍රමාණය(ව.මී.) | නේවාසික(ව.මී.1කට) | නේවාසික නොවන(ව.මී.1කට) |
| | ව.මී.400 දක්වා | රු.20.00 | රු.25.00 |
| | ව.මී.401-1000 | රු.22.00 | රු.27.00 |
| | ව.මී.1001-1500 | රු.25.00 | රු.30.00 |
| | ව.මී.1501-2000 | රු.25.00 | රු.32.00 |
| | ව.මී.2000ට වැඩි | වැඩිවන සෑම ව.මී.90ක් සඳහාමරු.2,000.00 බැගින් | වැඩිවන සෑම ව.මී.90ක් සඳහාමරු.2,000.00 බැගින් |

| | | |
|---|---|---|
| 9.වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන<br><br>i.පිහිනුම් තටාක (තටාකයේ ඩෙක් සමග)<br><br>සහ<br><br>ii.සූර්ය පැනල සඳහා වන ගාස්තු | වර් ග ප්‍රමාණය (ව.මී.) | ගාස්තුව රු. |
| | ව.මී.300 දක්වා | රු.6,000.00 |
| | ව.මී.301-500 | රු.15,000.00 |
| | ව.මී.501-1000 | රු.30,000.00 |
| | ව.මී.1000ට වැඩි | රු.22,500.00 + වැඩිවන සෑමව.මී.100 හෝ ඉන් කොටසක් සඳහා රු1,000.00 බැගින් |
| 10.( i.)අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වනසේ සාදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම<br><br>(i i)ගෙවීම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත | මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩි වන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව<br><br>මුල් අනුමැතියේදි ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25% | |

| | | |
|---|---|---|
| සැලැස්ම තුල සිදුකරනු ලබන වෙනස් කිරීම් | | |
| 11.සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැවරීම | රු.18,750.00 | |
| 12.සංවර්ධන බලපත්‍ර යේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම | i.) ව.මී.1000 දක්වා | රු.3,750.00 |
| | ii)ව.මී. 1000ට වැඩි | රු.7,500.00 |
| 13. වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුළ ලබා දි නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු) | සියළුම වාහන සඳහා රු.187,500.00 | |
| 14.රථවාහන නැවැත් වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිතා කිරීම. | එක ඉඩකඩක් සඳහා රු.15,000.00 ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්වීමට පරිවර්ථනය වනතෙක් 10% ක වර්ධකයක් සහිතව | |

16. ආවරණ අනුමැතිය ලබාදීම සඳහා වන සේවා ගාස්තු (පෙරසැරි ගාස්තු වලට අමතරව)

| සංවර්ධනයේ ස්වභාවය | අයකල යුතු ගාස්තු (බදු රහිත) | |
|---|---|---|
| 1. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදු කරන ලද ඉඩම් බෙදිමක් සඳහා | ඉඩම් කැබලි 1ක් සඳහා රු. | |
| අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම් /එකතු කිරීම්/නැවත ඉදිකිරීම් | නේවාසික (ව.මී.1 කට) | නේවාසික නොවන (ව.මී. 1කට) |
| i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා) | රු.150.00 | රු.375.00 |
| ii. වහල මට්ටම දක්වා ඉදිකිරීම්, ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට(වහලය හැර) | රු.225.00 | රු.750.00 |
| iii.වහලය සහිත බිත්ති ඉදිකිරීම | රු.300.00 | රු.1125.00 |
| iv.පදිංචිය සඳහා සුදුසු පරිදි ඉදිකිරිම සම්පූර්ණ කිරීම. | රු.375.00 | රු.1500.00 |
| v.මායිම් තාප්ප/රැඳවුම් බිත්ති | රු.150.00 | රු.375.00 |

| | | |
|---|---|---|
| ඉදිකිරීම | | |
| vi. විදුලි සංදේශ ,සම්ප්‍රේෂණ සහ බිම්පාදක ඉදිකිරීම<br>ඇන්ටනා කුළුණු ඉදිකිරීම,වහල මුදුන ඉදිකිරීම | | රු.112,500.00<br>රු. 75,000.00 |
| 2.අනුකූලතා සහතික (COC) ලබා නොගෙන පදිංචි වීම | | දිනකට රු.100.00 |

අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු

| සංවර් ධන කාර් යයේ ස්වභාවය | අයකල යුතු ගාස්තු(බදු රහිතව) | | |
|---|---|---|---|
| 1.ඉඩම් අනු බෙදීම් කිරීම | එක් කැබැල්ලකට රු.1,000.00 | | |
| 2.ගොඩනැගිලි ඉදිකිරීම | ගෙබිම් ප්‍රමාණය (ව.මී.) | නේවාසික | නේවාසික නොවන |
| | ව.මී.400 දක්වා | රු.3,000.00 | රු.3,750.00 |
| | ව.මී.400 වැඩි | රු.3,000.00 + ව.මී.400ට වැඩිවන සෑම ව.මී.1කටම හෝ ඉන් කොටසක් සඳහා රු.15.00 බැගින් | රු.3750.00 + ව.මී.400 ට වැඩිවන සෑම ව.මී.1 කටම හෝ ඉන් කොටසක් සඳහා රු.25.00 බැගින් |
| 3.සංනිවේදන කුළුණු ,ඇන්ටනා කුළුණු, සම්ප්‍රේෂණ කුළුණු සඳහා | රු.5000.00 | | |
| 4.මායිම් තාප්ප හා රැඳවුම් බැම් | දික් මීටර් 1 කට රු.25.00 බැගින් | | |
| 5.පොදු ගොඩනැගිලි සඳහා වන අනුකූලතා සහතික අළුත් කිරීම් | රු.10,000.00 | | |

17. <u>රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය ලබාදීම වෙනුවෙන් දෛනික ගාස්තු අය කිරීම පහත සඳහන් පරිදි වේ.</u>

| අනු | කාරණය | මුදල් අයකිරීම | |
|---|---|---|---|
| | | ක්‍රීඩාංගනය සඳහා | වොලිබෝල් ක්‍රීඩා පිටිය සඳහා |

| අංක | | දිවා කාලය<br>පෙ.ව. 7.00 සිට<br>ප.ව. 5.00 දක්වා | රාත්‍රී කාලය<br>ප.ව. 6.00 සිට<br>පසුදා පෙ.ව. 6.00 දක්වා | දිවා කාලය<br>පෙ.ව. 7.00 සිට<br>ප.ව. 5.00 දක්වා | රාත්‍රී කාලය (සම්පූර්ණ ආලෝකය සහිතව)<br>ප.ව. 6.00 සිට<br>පසුදා පෙ.ව. 6.00 දක්වා |
|---|---|---|---|---|---|
| 1. | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළ විශේෂිත ක්‍රීඩා වැඩසටහන්<br>(පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීම් කළ යුතුය) | දෛනික ගාස්තු නිදහස්<br>තැන්පත් ගාස්තු නිදහස් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් |
| 2. | ක්‍රීඩා අමාත්‍යාංශ (මධ්‍යම/පළාත්) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>නිදහස් |
| 3. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සහෝදර රාජ්‍ය ආයතන වල (පාසැල් හැර) විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු නිදහස්<br>තැන්පත් ගාස්තු රු.10,000.00<br>ජල,විදුලි හා වෙනත් සේවා ගාස්තු<br>රු.2000.00 | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>රු.10,000.00<br>ජල,විදුලි හා වෙනත් සේවා ගාස්තු<br>රු.2000.00 | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00<br>ජල,විදුලි හා වෙනත් සේවා ගාස්තු<br>රු.2000.00 | දෛනික ගාස්තු<br>නිදහස්<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00<br>ජල,විදුලි හා වෙනත් සේවා ගාස්තු<br>රු.2000.00 |
| 4. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අර්ධ රාජ්‍ය ආයතනවල විශේෂිත ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු<br>රු.8,000.00<br>තැන්පතු ගාස්තු<br>රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.8,000.00<br>තැන්පත් ගාස්තු | දෛනික ගාස්තු<br>රු.5,000.00<br>තැන්පත් ගාස්තු රු.5,000.00 | දෛනික ගාස්තු<br>රු.5,000.00<br>තැන්පත් ගාස්තු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රු.10,000.00 | | රු.5,000.00 |
| 5. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි අංකයක් සහිත ක්‍රීඩා සමාජ, යෞවන සමාජ, මඟින් සංවිධානය කරනු ලබන විශේෂිත ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු- රු.8,000.00<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.8,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.5,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00 | දෛනික ගාස්තු<br>රු.10,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00 |
| 6. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත සහෝදර රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතන සඳහා හා ලියාපදිංචි අංකයක් සහිත ක්‍රීඩා සමාජ, යෞවන සමාජ වැනි සංවිධාන වල ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු රු.10,000.00<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.10,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.5,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00 | දෛනික ගාස්තු<br>රු.10,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00 |
| 7. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල<br>ප්‍රදේශයෙන් පිටත පාසල් වල විශේෂ ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු රු.8,000.00<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.8,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.5,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00 | දෛනික ගාස්තු<br>රු.5,000.00<br>තැන්පත් ගාස්තු<br>රු.5,000.00 |
| 8. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පාසල් වල විශේෂ ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු නිදහස්<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු නිදහස්<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු නිදහස්<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු නිදහස්<br>තැන්පත් ගාස්තු රු.10,000.00 |
| 9. | පුද්ගලික ආයතන මඟින් සංවිධානය කරන විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු රු.20,000.00<br>තැන්පත් ගාස්තු රු.10,000.00 | දෛනික ගාස්තු<br>රු.25,000.00<br>තැන්පත් ගාස්තු | දෛනික ගාස්තු<br>රු.10,000.00<br>තැන්පත් ගාස්තු | දෛනික ගාස්තු<br>රු.10,000.00<br>තැන්පත් ගාස්තු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රු.10,000.00 | රු.5,000.00 | රු.5,000.00 |

| අනු අංකය | කාරණය | මුදල් අය කිරීම | | |
|---|---|---|---|---|
| | | දිවා කාලය<br>පෙ.ව.7.00 සිට ප.ව. 5.00 දක්වා | රාත්‍රී කාලය<br>ප.ව.6.00 සිට පසුදා අළුයම 2.00 දක්වා | දිවා රාත්‍රී දෙකට<br>පෙ.ව.7.00 සිට පසුදා අළුයම 2.00 දක්වා |
| 10. | සැණකෙලි,සංගීතප්‍රසංග,වෙළඳ ප්‍රදර්ශන,ආගමික හා සංස්කෘතික වැඩසටහන්,විශේෂ වැඩසටහන්,රැස්වීම් සඳහා | රු.30,000.00 | රු.40,000.00 | රු.60,000.00 |
| ඇප තැන්පතු - ක්‍රීඩා පිටිය සඳහා ගෙවන මුදල මෙන් 5 ගුණයක් ඇප තැන්පතුව ලෙස තිබිය යුතුය | | | | |

❖ <u>**එබවැව ක්‍රීඩාංගනය ලබාදීම වෙනුවෙන් දෛනික ගාස්තු අයකිරීම පහත සඳහන් පරිදිවේ.**</u>

| අනු අංකය | **කාරණය** | **මුදල් අයකිරීම** | |
|---|---|---|---|
| | | **ක්‍රීඩාංගනය සඳහා** | |
| | | **දිවා කාලය**<br>**පෙ.ව. 7.00 සිට**<br>**ප.ව. 7.00 දක්වා** | **රාත්‍රී කාලය**<br>**ප.ව. 6.00 සිට**<br>**පසුදා පෙ.ව. 6.00 දක්වා** |
| 10. | සැණකෙලි හා සංගීත ප්‍රසංග සඳහා ලබා දෙන්නේ නම් පමණක් | දෛනිකගාස්තු<br>රු.7,500.00<br>තැන්පත් ගාස්තු රු.1,250.00 | දෛනික ගාස්තු<br>රු.12,500.00<br>රු.1,250.00 |

**සැ.යු. –**

**තැන්පතු වශයෙන් අය කරන මුදල තරඟ අවසානයේදී ක්‍රීඩාංගන භාරකරුගේ වාර්තාව අනුව ක්‍රීඩාංගනය සඳහා යම් කිසි අලාභහානියක් සිදු වී නොමැති නම්, තැන්පත් කළ මුළු මුදලම ආපසු ගෙවීමටත්, අලාභ හානියක් සිදු වුයේ නම් අලාභය ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරියෙකු ලවා තක්සේරු කර එම මුදල තැන්පත් මුදලින් අඩු කරගෙන ඉතිරි මුදල ආපසු ගෙවීමටත්, තැන්පතු මුදලට වඩා වැඩි අලාභයක් සිදු**

**වුයේ නම් කාර්මික නිලධාරි වාර්තාව අනුව අදාළ පාර්ශවය වැඩිපුර වන මුදල සභාව වෙත ගෙවීමට බැදී සිටිය යුතු**

18.කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීම

කොම්පෝස්ට් පොහොර 1**kg** ක මිල රු. 15.00 කි.

100**kg** ට වැඩි මිලදී ගැනීමකදී වැඩිවන සෑම1**kg** ක් රු.12.00 බැගින් 1000**kg** දක්වාද

1000 **kg** ටවැඩි මිලදී ගැනීමකදී වැඩි වන සෑම 1**kg** ක් සඳහා රු.10.00 බැගින්ද මිල නියම වේ

( 1**kg** -100 **kg** දක්වා 1**kg**ක් රු.15.00 බැගින්)

(101 **kg** -1000 **kg** ක් දක්වා 1**kg**ක් රු.12.00 බැගින්)

(1001 **kg** සිට ඉහලට 1 **kg**ක් රු.10.00 බැගින්)

19. ආදාහනාගාරය හා සුසාන භූමි ලබාදීම වෙනුවෙන් ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | රු.12000.00 |
| 02. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | රු.14000.00 |
| 03. | භූමි දාන ගාස්තු | රු.200.00 |

20. මාර් ග පළුදු කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම පහත පරිදි වේ.

මාර් ග පළුදු කිරීමට අවසර ලබා දීමේදී රු. 3000.00 ක ඇප තැන්පතු මුදලක් ගෙවිය යුතු අතර, ආපසු නොගෙවන ගාස්තුවක් වශයෙන් රු. 2000.00 ක මුදලක් ගෙවිය යුතුය.

21. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අයකිරීම සම්බන්ධව පහත සඳහන් පරිදි ගාස්තු පැනවීම

- අලුතින් කර් මාන්තයක් ආරම්භ කරන විටදී සහ බලපත්‍රය අලුත් කිරීමකදී මූලික ආයෝජනය මත පාදක වූ සංශෝධිත පරීක්ෂණ ගාස්තුව

| මූලික ආයෝජනය (රු) | ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව (රු) |
|---|---|
| 250,000/- ට අඩු | 3000/-+ රජයේ අනුමත බදු |
| 250,001/- ත් 500,000/- දක්වා | 3750/-+රජයේ අනුමත බදු |
| 500,001/- ත් 1,000,000/- දක්වා | 5000/-+ රජයේ අනුමත බදු |
| 1,000,001/- ට වැඩි | 10,000/-+ රජයේ අනුමත බදු |

- පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව

| | | |
|---|---|---|
| බලපත්‍ර ගාස්තුව | රු 4500/- | වසර 3 ක් හෝ ඊට අඩු කාලයක් (වලංගු කාලය) |

- නියමිත දිනට බලපත්‍ර අලුත් කිරීමේදී ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව අය නොකෙරේ.(බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවීමට පෙර)

- නියමිත දිනට  දිනක් හෝ ප්‍රමාද වී අයදුම් කරන විටදී (බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවූ පසු) මූලික ආයෝජනය මත පදනම්ව අදාළ පරීක්ෂණ ගාස්තුවෙන් 50% මුදලක් අය කෙරේ.

| අයදුම්පත්‍රය | ගාස්තුව( රු) |
|---|---|
| 1. අලුතින්ම පරිසර  ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම  සඳහා වන අයදුම්පත | 200.00 |
| 2. පරිසර ආරක්ෂණ බලපත්‍රය වසර 3 කට වරක් අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව | 150.00 |

<u>**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**</u>

<u>**2026 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකර ගැනීම**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ තිබෙන යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයෙකු  හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% සමාන බද්දක් විකුණුම්කරු  හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයින් හෝ නියෝජිතයා විසින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.(මෙම බද්ද ගෙවීම අදාල වර්ෂය අවසානයට පෙර ගෙවිය යුතු බවත් මෙම බද්දට අමතරව රජය විසින් පනවනු ලබන බදු අය කරනු ලැබේ.

<u>**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**</u>

<u>**2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් /දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වන වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වන දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියක,පාරක,ඇලකට,වැවකට,මුහුදට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2026 වර් ෂයේ සිට අය කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

<u>**උපලේඛනය**</u>

**(රු. ශත)**

01.බිත්තියක හෝ පුවරුවක හෝ ලැල්ලක හෝ ලී හෝ

ගැල්වනයිස් බට යොදා හෝ කොන්ක්‍රීට් කණු යොදා

සවි කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරුවක්

සඳහා වර් ග අඩියකට <u>වසරකට</u> රු.100.00

02.රෙදි මත පින්තාරු කරන ලද හෝ ඩිජිටල් මුද්‍රණ

සකසන ලද වෙනත් ඕනෑම බැනරයක් ප්‍රදර්ශනය

කිරීම වෙනුවෙන් සෑම වර් ග අඩියක් සඳහා

<u>මාසයක් හෝ ඉන් කොටසක් සඳහා</u> රු.50.00

**<u>02</u>**

**<u>ඊ11</u>**

පළාත් පාලන සේවා පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් එවන ලද 658699 අංක දරණ චෙක්පත (රුවන්වැල්ල මහජන පුස්තකාලයේ රැඳවුම් බැම්ම ඉදි කිරීම) අදාල කොන්ත්‍රාත් සමිතිය වන සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

චෙක්පත් වටිනාකම -1526700.16

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන සේවා පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් එවන ලද 658699 අංක දරණ චෙක්පත (රුවන්වැල්ල මහජන පුස්තකාලයේ රැඳවුම් බැම්ම ඉදි කිරීම) අදාල කොන්ත්‍රාත් සමිතිය වන සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සඳහා(චෙක්පත් වටිනාකම -1526700.16 ) ගරු මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට , ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**උ. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

1. 2025.12.22 දින කාර්මික සේවා කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක 02)
2. 2025.12.24 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක03 )
3. 2025.12.24 දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක04 )
4. 2025.12.19 දින පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව (ඇමුණුම් අංක05)

යන කාරක සභා වාර්තා සභා ගත කෙරෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ඌ. 2025 දෙසැම්බර් මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ගෙවීම් සාරාංශය, ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, මාසික ගෙවීම් වාර්තාව හා වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.(මෙම වාර්තා සභා දිනයේදී ලබා දීමට කටයුතු කෙරුණි.)**

**<u>ඌ 01</u>**

2025 නොවැම්බර් මස අභ්‍යාන්තර විගණන වාර්තාව(ඇමුණුම 06 )

**<u>ඌ 02</u>**

2025 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව

**<u>ඌ 03</u>**

2025 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය

**<u>ඌ 04</u>**

2025 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය

**<u>උප 05</u>**
2025 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය
**<u>උප 06</u>**
2025 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය
**<u>උප 07</u>**
2025 දෙසැම්බර් මස ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව
**<u>උප 08</u>**
2025.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව
යනාදී මෙම වාර්තා සභා ගත කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

2025.12.31 දිනට මූල්‍ය තත්වය

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**
**<u>2025.12.31 දිනට මූල්‍ය තත්වය</u>**

| **බැංකුවේ නම** | **ගිණුම් අංකය** | **මුදල** |
|---|---|---|
| මහජන බැංකුව රුවන්වැල්ල | (පොදු ගිණුම) 081-1-001-3-4928744 | 22,911,302.25 |
| මහජන බැංකුව රුවන්වැල්ල | (සේවක ණය ගිණුම) 081-1-001-7-4928780 | 741,177.54 |
| **ස්ථාවර තැන්පත්** | | |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව - රුවන්වැල්ල | | 1,000,000.00 |
| මහජන බැංකුව රුවන්වැල්ල | | 40,000,000.00 |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව - රුවන්වැල්ල | | 10,000,000.00 |
| | **එකතුව** | **74,652,479.79** |

**එ. සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සියලුම දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. සභාපතිතුමාටත් මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාටත් ලේකම් මහතා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත්. ප්‍රථමයෙන්ම සභාපතිතුමනි අපිට දිට්වා සුළි කුනාටුවක් සමග අපේ රුවන්වැල්ල බල ප්‍රදේශයේ ලොකු විනාශයකට සිද්ධවුනා . අපේ සමගි බලවේගයේ ගරු විපක්ෂ නායකතුමා රුවන්වැල්ල බල ප්‍රදේශයට පැමිණියා එම අවස්ථාවේදී පොරොන්දු වූ පරිදි කරවනැල් මූලික රෝහලට ලක්ෂ විසි අටක උපකරණ ප්‍රමාණයක් ලබා දුන්නා .සෞඛ්‍ය මට්ටමෙන් අඩුවෙලා තියෙන අවස්ථාවක ජනතාවගේ සෞඛ්‍ය මට්ටම ඉහල නැංවීම සඳහා න පරිත්‍යාගයක් වශයෙන් ගරු සුජිත් සංජය මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් ඒ වගේම ගරු නිහාල් ෆාරුක් මැතිතුමත් සම්බන්ධ කරගෙන මෙම අවස්ථාව ජනවාරි මාසයේ පළවෙනිම දවසේ දී කරවනැල්ල මූලික රෝහලට ලබා දුන්න. අපි සියලු දෙනාත් ඒ සම්බන්ධව

සහභාගී වුණා. ඇත්තටම විපක්ෂ නායකතුමාටත් ඒ සම්බන්ධව ක්‍රියා කරපු සියලු දෙනාටත් මාගේ ස්තුතියි ගෞරවය මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වගේම තමා ගරු සභාපතිතුමනි, අපි එදා එතනදී දැක්ක දෙයක් තමයි කරවනැල්ල මූලික රෝහලට ඇත්තටම රථ ගාලක් නැහැ . හැමෝම මහජනතාව ඉතාමත් ප්‍රශ්නයකට මුහුණ දීලා තියෙනවා. හරිම ගැටළුවක් මූලික රෝහලක් වෙලත් රථ ගාලක් නෑ කියන්නේ රෝගියා අරගෙන යනවා ඒ ගමන්ම ඒ කට්ටිය තල්ලු කරල පල්ලෙහාට එවනවා. රාත්‍රියට ආවොත් දැඩි අපහසුතාවයකට පත්වෙනවා. රෝගියා වෙනුවෙන් කවුරු හරි වාහනේ ක අවනම් ඒගොල්ලන් එතන රැඳිලා ඉන්න ඕනෙ ටිකක් හරි පැයක් දෙකක් හරි පල්ලෙහාට ගෙනල්ල කොහේ හරි දාගන්න කිව්වහම ඒ මනුස්සයාට ආරක්ෂාවකුත් නැහැ.පාරේ ආරක්ෂාවකුත් නැහැ ඒ හින්දා ඔබතුමාලාගේ දැඩි අවධානයක් යොමු කරලා සම්බන්ධීකරණයේ හරි කතා කරලා කරුවනැල්ල නගරයට රෝහල මූලික කරගෙන ඇතුලේ ස්ථානයක් සුදුසු ස්ථානයක් රථ ගාලා පවත්වාගෙන යන්න ඉඩ දුන්නනම් මහජනතාව ඒ දුෂ්කරතාවයෙන් මුදවා ගන්නට අපට හැකි වෙනවා අපිට තමා ඒකෙ තියෙන්නෙ බලය .ජනතාව අපහසුවට පත්වෙන්නෙ අපේ රුවන්වැල්ල ප්‍රදේශයේ ජනතාව ඒ වගේම බාහිරින් සැහෙන ප්‍රමාණයක් මූලික රෝහලට පැමිණෙනවා ඒ ගැන ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා ස්තුතියි.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

මේ පිළිබඳව අපි සාකච්ඡා කළා. දැඩි ගැටලුවක් තියෙනවා කියලා දන්නවා අපි. ඒක දීර්ඝ කාලයක් තිස්සේ පැවතිච්ච දෙයක් .ඒ වගේම හදිසි ප්‍රතිකාර ඒකකයක් අපි පටන් ගත්තා එතන මුල්ගල තැබීම කළා. මේ වසර තුළ අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. පරණ කැන්ටිම තිබ්බ්ච තැන.මිලියන 263ක දැවැන්ත ව්‍යාපෘතියක් .ඒවගේම ඊට ඉස්සර වෙලා විශේෂඥ වෛද්‍යවරුන්ගේ වෙනම නේවාසිකාගාර හදන්න මුල්ගල තැබීමක් කළා. ඇත්තටම විශේෂඥ වෛද්‍යවරු කරවනැල්ල රෝහලේ වැඩි පිරිසක් ඉන්නවා .හිටියට ඔවුන්ට කිසි කෙනෙකුට රැඳී ඉන්න විදිහක් නෑ. වැඩි කාලයක් මෙහේ රැඳිලා ඉන්න පුළුවන්කමක් නැහැ. ඒගොල්ලෝ පෞද්ගලික තැන්වල තමයි ස්ථානගත වෙලා හිටියේ .ඒ හින්දා ඒ වෙනුවෙන් කල්පනා කරලා තමයි අපි ගිය අවුරුද්දේ මුලු ගල තැබීම් කලා. ඒ ස්ථානයත් යටවෙන බව දැනුම් දීලා තියෙනවා .වෙනත් ටිකක් උඩට ගේන්න තමයි එතනම තීරණය කරල තියෙන්නේ . අපි ඇත්තටම මේ කෙටි කාලය තුළ ඒ වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරලා තියෙනවා රථගාල සම්බන්ධයෙන් විශේෂයෙන් රෝහලේ අධිකාරි වෛද්‍ය වජිරංග වෛද්‍යතුමා කථා කළා. මේ සම්බන්ධයෙන් පිළියමක් කරමු කියලා. ඒ පිළිබඳවත් අපි සාකච්ඡාවක ඉන්නවා .අපි බලනවා ඒ සම්බන්ධයෙන් පල්ලෙහා වත් පුලුවන්ද කියන එක .මම අගය කරනවා පුෂ්පකාන්ති ගරු මන්ත්‍රීතුමිය එවැනි අදහසක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හොඳ අදහසක් බව මම හිතනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සභාපතිතුමනි අර හැඳුනුම්පතට ෆොටෝ ගන්න කට්ටියක් ආවෙ නැනේ. ඒ සම්බන්ධව ලේකම්තුමා වෙන දිනයක් දාගෙන කටයුතු කරනවා නම් හොඳයි කියලා හිතනවා.ඒ වගේම අපේ මන්ත්‍රීවරුත් තිස්දෙනා වෙනුවෙන්ම කතා කරන්නේ ටෙලිෆෝන් බිලයි ගමන් ගාස්තුවත් ඕකටම එකතු කරානම් හොඳයි කියලා හිතනවා .

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා</u>**

ආදරණීය මන්ත්‍රීවරු සියළු දෙනාගෙන්ම අවසරයි. 2025 වසරේ මෑත භාගයේ දී ප්‍රාදේශීය සභා බලය හිමි කරගෙන එදා මෙදා තුරා සභාවේ වැඩකටයුතු ඉතාම මිත්‍රශීලීව ලෙන්ගතුව කාරුණිකව කිසිදු භේදයකින් තොරව සුහදව මේ වැඩකටයුතු සිද්ධ කරගෙන ආව. මුලින්ම ප්‍රාර්ථනා කරනවා මේ වසර ගරු සභාපතිතුමා ඇතුළු අපි සියලු දෙනාටම මේ සභාව ඉදිරියටම අරගෙන යන්න පුළුවන් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් අපි මේ පසුගිය කාල පරාසයේ ආපස්සට හැරිලා බැලුවොත් මේ සභාවේ බලය ලබාගැනීමට සමගාමීවත් පෙරාතුව මේ රුවන්වැල්ල බල ප්‍රදේශයේ පිළිබඳව ප්‍රාදේශීය සභාවේ වසර ගණනාවක බලයක් දේශපාලන අධිකාරි බලයක් නොතිබූ අවස්ථාවක දේශපාලන බලයක් හිමි කරගෙන ඒ සභාවේ අවට බල

ප්‍රදේශය තුළ තිබ්ච්ච යම් යම් ගැටලුවලට සාධනීය පිළිතුරු අපට දෙන්න හැකියාවක් ලැබුණා .ඒ වගේම මතක් කරන්න කැමතියි පසුගිය මාස හයකින් පමණ කාල පරාසයක් තුළ මේ රුවන්වැල්ල බල ප්‍රදේශයට අපි ආණ්ඩුවක් වශයෙන් මුහුණ දීලා දැවැන්ත අභියෝග ආවත් ඒ අභියෝග හමුවේ රුවන්වැල්ල බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලක්ෂ කෝටි විස්සකට අධික මුදලකින් සංවර්ධන ව්‍යාපෘති වලින් හැම කොට්ඨාශය සභාවක් කේන්ද්‍ර කර ගනිමින් සිද්ධ කරපු බව පැහැදිලිව මතක් කරන්න කැමතියි. ඒ වගේම මන්ත්‍රීතුමිය මතක් කරා වගේම ඒකෙන් වැඩි කොටසක් කරවනැල්ල මූලික රෝහලටත් යොදවන්න වෙනම මුදලක් යොදවල මූලික රෝහල සංවර්ධනය කිරීමටත් අපේ ව්‍යාපෘති ගණනාවකට මුල්ගල තිබ්බ .ඒවගේම බලනකොට අපිට කෝටි ගණනාවක් මේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුකරමින් ගිහිල්ල ඒ වගේම විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් අපේ ප්‍රාදේශීය සභාවට පැවරිච්ච මේ වෙනකොට අවසන් කරලා තියෙනවා .ඒ වෙනුවෙන් සභාපතිතුමාටත් ඒ වෙනුවෙන් කටයුතු කරපු එතුමා ඇතුළු කාර්මික නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙන්න ඕනෙ .ඒ වෙනුවෙන් මැදිහත් කරණය වුණු අපේ මන්ත්‍රී සහෝදර සහෝදරියන්ටත් අපේ ස්තුතියි පුද කරන්න ඕන. මම හිතනවා 2026 වසර ඒ වගේම අපට සංවර්ධන ව්‍යාපෘති අපේ බල ප්‍රදේශය තුළ සිදුකරමින් මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ටික ඉටුකරගන්න අපිට හැකියාවක් ලැබෙයි. මම හිතන විදිහට ප්‍රාදේශීය සභාවට සිදු කළ යුතු කාර්යයන් පිළිබඳව ගත්තහම සභාපතිතුමා මූලිකවම කටයුතු කළද්දී වසර ගණනාවක් මේකේ පාලන බලයක් අහිමිවෙලා තිබිලා ඒ පාලන බලය ගන්නකොට ප්‍රශ්න ගොඩක් මේ සභාවේ ගොඩගැහිලා තිබ්බා. ගොඩගැහෙච්ච ඒ ප්‍රශ්නවලට මුහුණ දෙමින් අපි හැකි ආකාරයෙන් උපරිම හැම කොට්ඨාශයකටම සාධාරණ වන ආකාරයට යම් මුදල් ප්‍රමාණයක් පොදු පහසුකම් පිළිබඳව අපට සීයට සියයක් ඉටු කරන්න බැරි උනත් සියයට අසූවකට වැඩි ප්‍රමාණයක් කොට්ඨාශ සභාවලට ප්‍රාදේශීය සභාව මගින් ඉටු කරන්න ලැබීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. ඒ වෙනුවෙන් අපි මේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු කාර්ය සඳහා උරදීප සියලු දෙනාටත් අවස්ථාවක් කරගන්නා ස්තුති කිරීමක් පිළිබඳව ඒ වගේම අපි මේ වසර තුළ බලාපොරොත්තු වෙනවා මේ සභාවේ වැඩකටයුතු රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කොට්ඨාස සභා මට්ටමින් සංවර්ධන වැඩ කටයුතුවලට මේ වසර තුළත් මුහුණ දෙන්න වෙයි කටයුතුත් අපි සිදු කරමින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති සිදුකරමින් අපට ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්න හැකිවෙයි කියලා හිතෙනවා .ඒ වගේම රුවන්වැල්ල ප්‍රාදේශී සභාවේ අද දින මේ අවස්ථාව සැලසීම පිළිබඳවත් අවස්ථාව සලසා දීම පිළිබඳ ස්තුතිවන්ත වෙමින් නිහඬව ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. සභාපතිතුමා ලේකම්තුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාටත් සියලුම දෙනාගේ පවුල් වල අයටත් ලැබුවා වූ වසර සුභම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මාස හයක් වැනි කෙටි කාලයක් තුළ විශාල කාර්යභාරයක් කළා ඒ වෙනුවෙන් ප්‍රමුඛතාවය ගැන කටයුතු කරපු අපේ සභාපතිතුමාට මම විශේෂයෙන්ම ස්තුතිය පුදකර සිටිනවා. ඒ සඳහා දායකත්වය දුන්නු අපේ උපසභාපතිතුමාටත් ලේකම්තුමාටත් මම ස්තුතිවන්ත වෙනවා මම ප්‍රකාශ කරන්නම්. කොට්ඨාශය තුළ මේ වන තුරා කරපු කාර්යභාරයෙන් කොටසක් අපි මේ වෙනකොට අමිතිරිගල කොට්ඨාසයේ කොන්ක්‍රීට් කරලා මාර්ග සංවර්ධනය කරලා තියෙනවා ලක්ෂ පනස් නවයක. ඒක ලොකු ජයග්‍රහණයක් ලක්ෂ පනස් නවයක.එයිට අමතරව අක්‍රිය වෙලා තිබුණු විදුලි බල්බ නගරය තුළ අක්‍රිය වෙලා තිබුණු සෑම ප්‍රදේශයක්ම ආවරණය වන ලෙස අපි විදුලි බල්බ යොදලා තියෙනවා. කිසිම වර්ගීකරණයක් නැතුව .සෑම ප්‍රදේශයකම කොටස් කොටස් හරි මේ වෙනකොට අවසන් කරලා තියෙනවා .ඊට පස්සේ සභාපතිතුමාට සහ උපසභාපතිතුමාට මම විශේෂ ස්තුතියක් කරනවා ලේකම්තුමාටත් නායගිය නිවෙස් වල අපට අයිති නොවුනත් අපේ කරට වැටුණු කොටසක් තිබුනා .මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අපිට ඒ කොටස දාලා තිබුණා ඒ කොටස අපිට අයිති නෑ ඒත් ඒ බර අපි කරට ගත්තා .සභාපතිතුමාට ස්තුතිය පුදකරනවා දවස්එකහමාරක් වගේ පැය ගානක් වැය කරලා පස් අයින් කරලා දුන්නා නිවැසියන්ට සාමාන්‍යයෙන් වැඩ කරන ප්‍රමාණය ලක්ෂයකට ලොකු වියදමක් අපි එතැනට දැරුවා. ඒ වෙලාවෙ ඒ නිවැසියන්ට අපි ලොකු ධෛර්යයක් නායකත්වයක් දුන්නා .ඇත්තටම ගොඩක් ප්‍රශංසාත්මකව කතා කළා. සභාව ගැන මම මේ අවස්ථාව ඒ වෙනුවෙන් ස්තුතියි පල කරන්නත්

යොදාගන්නවා .කාලයක් වහලා තිබුන පුස්තකාලේ ඒක විවෘත කරනවා නව රජයේ පත්වීමත් සමඟ අපේ සභාව විසින් කඩිනමින් පාඨකයින්ට පුස්තකාලය විවෘත කරලා දුන්නා .අද ඉතාමත් හොඳ තත්ත්වයක පුස්තකාලේ පවතිනවා. ඒ වෙනුවෙන් ස්තුතියි පුදකර සිටිනවා . බැලුවහම අම්තිරිගල කොට්ඨාශයට අපි ඉමහත් සේවයක් කරලා තියෙනවා. ඒ වෙනුවෙන් මම රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සභාපතිතුමා ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලයටත් ඒ වෙනුවෙන් වචනෙකින් හරි උදව් කරපු සියලු දෙනාටත් ස්තුතිය පුද කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා</u>**

මුලාසනයෙන් සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි .මාලිමා රජය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව මුල් කරගෙන දන්නොරුව කොට්ඨාශයේ ව්‍යාපෘති ගොඩාක් ආරම්භ කළා. විශේෂයෙන්ම පාරවල් අටක් කොන්ක්‍රීට් කරලා අවසන් කලා. අක්‍රිය බල්බ් විස්සක් දැම්මා. වැදෑවල ඇළ ගොඩ දැම්මා ගෙවල් නැති අයට ගෙවල් දෙකක් ලබා දුන්නා. මුදල ලක්ෂ විස්සක් සම්පූර්ණයෙන් මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඇළ ගොඩ දැමීම සඳහා ගෙවල් සඳහා වියදම් වෙලා තියෙනවා.රජය වියදම් කරලා තියෙනවා අනු ලක්ෂයක්. ගොඩක් සන්තෝෂයි දන්නොරුව කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාටත් උපසභාපතිතුමාටත් මන්ත්‍රී මණ්ඩලයටත් නව රජයටත් කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන්ප්‍රනාමය පුදකර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා</u>**

ගරු සභාපතිතුමනි. හත්වැනි ප්‍රාදේශීය සභා වාරය මේක. මම හිතන්නේ අපි සැසිවාර හයක් විතර පවත්වල තියෙනවා මේ සැසිවාර හය තුළ අපි බොහෝ දේවල් කතා කළා. ඒත් එක්කම ගොඩක් දුරට මගේ හඬනම් නිහඬ වුණා. හේතුව මම අධ්‍යානය කළා නවක මන්ත්‍රීවරයෙක් විදිහට. ඉතින් අද දවස ගත්තොත් වර්ෂයක් ගෙවිල ඒ වර්ෂ අවසානයේ අපේ කොට්ඨාශයට වහරක කොට්ඨාශයට අපි කරපු සේවාවන් පිළිබඳව පුංචි ස්තුති කතාවක් කරන්න තමයි මම මේක අවස්ථාවක් කර ගන්නේ .අපි දන්නවා පහුගිය කාලයේ ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා කොට්ඨාශයේ පාරවල් හතරක් දක්ෂ විස්ස ගානේ යොදලා ඒ පාරවල් වලින් සියයට හැත්ත පහක් පමණ අවසන් කරගන්න පුළුවන් පාරවල් හතරක් අපි ට සංවර්ධනය කරලා වැඩකටයුතු අවසන් කළා ලක්ෂ අසූවක මුදලක් මේ සඳහා වැය වුණා .ඒත් එක්කම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත් වෙලා ආපු මුදල් වලින් ලක්ෂ දහයක මුදල් යොදවල වතු පාරක් සහ ඒත් එක්කම මාගල්කන්ද පාර ලක්ෂ විස්සක සාපේක්ෂව ලක්ෂ දහයේ ඒවා දෙකක් වශයෙන් දාල සංවර්ධනය කරන්න පුළුවන්න් වුණා. ඒත් එක්කම අපි දන්නවා පුංචි කාලේ ඉඳන් අපි පත පොත පරිශීලනය කරපු මහජන පුස්තකාලයේ සෑහෙන කාලයක සිට සංවර්ධනයට ලක්වෙලා තිබුණෙ නැහැ .ලක්ෂ දාහතක මුදලක් වෙන් කරලා ඉතාමත්ම ලස්සනට ඒ වැඩේ ඉවර කරලා නගරයේ මැද්දෙ තිබ්ච්ච පරණ ගොඩනැගිල්ල වෙනුවට දැකුම්කළු ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කරලා මේ වෙනකොට වැඩ කටයුතු අවසන් කරලා තියෙනවා ඒත් එක්කම අපි දන්නවා පසු සම්පත් එක මැදිහත් වෙලා මෙතන මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඒ ප්‍රයෝජනය ගත්තාද කියලා ප්‍රශ්නය මට තියෙනවා විශාල මිනිස්සුන්ට සේවයක් කරන්න පුළුවන් ආයතනයක් ඍජුව මැදිහත් වෙලා එතෙන්ට ගිහිල්ලා අපි කිකිළි පැටවුන් 1200ක් පමණ මාස එකහමාරක් පමණ සංවර්ධනය කරලා හදබිම අධිකාරයේ මැදිහත්වීමෙන් අපේ ප්‍රදේශයට ගෙනල්ල ඒ ගොල්ලන්ට අපි බෙදලා දුන්නා .1150 ක් විතර වෙනවා කිකිළි පැටියෙක් ගෝනගල්දෙණියට එනකොට වියදම .මේ සමස්ත ක්‍රියාවලියත් එක්කම අපට තිබ්ච්ච ආයතන තමයි ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පශු සම්පත් එක ගොවිජන කේන්ද්‍රය හරහා මේ සමස්ත ක්‍රියාවලියටම සහාය දැක්වූ සියළුම රාජ්‍ය නිලධාරීන් සහ මේ සඳහා විශේෂ මැදිහක් වීමක් කරමින් මඟපෙන්වීම කරපු අපේ ගරු සභාපතිතුමාට අනේකවාරයක් ස්තුතිවන්ත වෙනවා අපි නවක මන්ත්‍රීවරු විදිහට මේ මාවතට යොමු කරලා ඒ ජයග්‍රහණ බිමට අරගෙන යන්න දායක වීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා ඒ වගේම උපසභාපතිතුමා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනේ සැම වෙලාවකදිම මේ සියලු ක්‍රියාදාමයන් එක්ක අපිත් එක්ක අත්වැල් බැඳගෙන අපිට ධෛර්ය සම්පන්න වෙන්න කතා කරල අපිව දිරිමත් කරලා මේ තත්ත්වයට ගෙනාවට මේ මාස හය

තුළ විස්සයි  විසිපහට දැක්වූ සහයෝගයට සමස්ත සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬවනු ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම් . සුසන්ත අජිත් කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමාගෙන් මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි .ගරු සභාපතිතුමනි, මම ඉඹුලානේ ඉඳන් මගේ වියදමින් ලයිට් ලාම්පු අරන් මගේ වියදමින් අහමඩ් එකෙන් ලාම්පු නවයක් දාලා බල්බ්  මගේ අතින් අරගෙන ඉඹුලානේ ඉඳන් කඩදරට දුම්මා. උපාලි මන්ත්‍රීතුමත් ලයිට් දෙක තුනක්ම ඒ පාරේ අඩුපාඩු දැම්ම . ඒවා ඔක්කොම මගේ මුදල්වලින් හැදුවෙ. අධිකාරී මන්ත්‍රීතුමත් ආවා ඒ අවස්ථාවේ මම ලයිට් දාන්න අවස්ථාවේදී මට පුළුවන් හැටියට අහමඩ් එකෙන් ලාම්පුවක් 1400 ට දුන්න මට ලාම්පු ලාම්පු නමයක් ගත්තා .ඉඹුලන හාඩ්වෙයාර් එකෙන්  බල්බ් නවයක් ගත්තා .එහෙම අරන් ඒ අඩුපාඩුවක් හදලා දුන්නා අපේ කොට්ඨාශයට.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. 2025 වර්ෂයේ මැද භාගයේදී ප්‍රාදේශීය සභාවේ බලය පිහිටවල 2025 වර්ෂය අවසාන වෙනකොට අපිට සභාවක් විදියටත් ඒ වගේම දේශපාලන ව්‍යාපාරයක් විදියටත් කොතනද ඉන්නේ කියන එක අපි අවබෝධ කරගන්න ඕනේ. අපි දන්නවා මේ වනවිට ජාතික දේශපාලනය තුළත් විවිධ අවලාද මඩ විශාල ව්‍යාපාරයක් විදිහට ගෙනියනවා .ඒකටත් එක්ක උත්තරයක් දෙන්නත් එක්ක තමයි සභාවේ නැගී සිටියේ .2025 වර්ෂයේ ලංකාව මූණ දුන්න දැවැන්තම අර්බුදයකට මුහුණ දුන්නා. ඒ තමයි දිට්වා සුළි කුණාටුව.ඒකෙදි අපේ දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බල ප්‍රදේශය දැඩි හානියකට පත්වෙච්ච ප්‍රදේශයක් .අපි මේ හැමතැනම මේ වෙනකොටත් ඇවිදිනවා  ඒ වෙලාවෙදි කියන්නෙ මන්ත්‍රීතුමා මෙයට ඉස්සර වෙලා වතුර ගලලා  තියෙනව ඇති වෙනකම් මේ අපේ රුවන් වැල්ලට හැබැයි අපිට කවදාවත් සත පහක්වත් හම්බවෙලා තිබුණෙ නැහැ. රජයෙන් කියල තඹ දොයිතුවක දෙයක්වත් දුන්නේ නෑ. යටවෙච්ච සෑම නිවසියෙකුටම රුපියල් විසිපන්දාහක මුදලක් රජය විසින් ලබා දුන්න ගේ හෝදන්න කවදාවත් පළවෙනි වතාවට ගෙවල් හෝදන්න රජයේ සල්ලි දීල නැහැ. පළවෙනි වටේ දෙවැනි වටය මේ වනවිට තමන්ගේ ආපදාවට ලක් වෙච්ච තමන්ගේ කුස්සියේ භාණ්ඩ ටික මේ ටික ගන්න පනස්දාහා ගානේ මේ වන විට ලබාදෙමින් තියෙනවා ලබා දීලා ඉවර වෙලත් තියෙනවා. බොහොම ස්තූතිවන්ත වෙනවා අපේ ඉංදික මන්ත්‍රීතුමා නියෝජනය කරන ගෝනාරම්භ කොට්ඨාශයේ ජලය යටවෙලා අඩි අටකටත් වැඩිය යට වෙච්ච පවුල් අටක් පමණ මේ වන විට ඒ කට්ටිය කියල තියෙනවා අපිට පනස්දාහේ දීමනාව එපා කියලා ඒක අගය කරන්න ඕනේ.පොඩි  වතුර ප්‍රමාණයක් දාලත් විශාල වශයෙන් මුදල් තියෙන දේපල තියෙන ඉඩකඩම් තියෙන මිනිස්සු මේ රුපියල් 25000 50,000 ගන්න බොරු කරද්දි මේ වගේ නිර්ව්‍යාජ මිනිස්සු මේ ආණ්ඩුව වෙනුවෙන් වැඩ කරන මිනිස්සු ප්‍රමාණයක් ඉන්නවා. ඒ වගේම මට ඊයේ හම්බ වුණා වගා හානි කට්ටිය මේවා දන්නෙත් නෑ කියන්නෙත් නෑ. වගා හානි වලට ගෙවපු විදිහ කෙසෙල් කොටුවක් මම හිතන්නෙ අක්කරේක විතර කෙසෙල් කොටුවක් විනාශ වෙච්ච කෙනෙක් මට කිව්වා සර් මට ජනවාරි පළවෙනිදා උදේ වෙනකොට රුපියල් ලක්ෂයක මුදලක් එයාගේ බැන්ක් එකවුන්ට් එකට දාලා තිබුණ කියලා. වගා හානි  වෙච්ච ඒවට ණය ගොවින්ට ලාභට රුපියල් 3750 බැගින් මේ වන විට සියලුම ආකාරයේ හානි සඳහා ජය ගෙවීම් කරලා තියෙනවා. ඒ වගේම තවත් ඉදිරියටත් ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා වගේ අර්ධ හානියට පත්වෙච්ච නිවාසයක් සඳහා සම්පූර්ණයෙන්ම නිවාසය පමණක් ම හානි වෙලා තියෙනවා ලක්ෂ පනහක මුදලක් ඒවගේම ඉඩම සහ නිවස දෙකම හානි වෙලා තියෙනවා නම් රුපියල් කෝටියක මුදලක් මේවා ඇඩ් එකට නෙමෙයි මේවා කිව්වේ කරන්න. අනිවාර්යයෙන්ම මේවා රජයේ මේ වන විට මේ සියලුම කාරයන් කරන ගමන්. උඩුමල්වත්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ ම මාස හය ඇතුළත ප්‍රාදේශීය සභාව ලබාගත්තා මාස හය ඇතුළත රජයේ රෝහලකරවනැල්ල ඒවට වියදම් කරපු ප්‍රමාණය නෙවෙයි අපි ගණනය කරන්නේ ඒවට විශාල මුදලක් වැය කරලා තියෙනවා .අපි පාරවල් ටික හදන්න ඒ වගේම අමුණු ටික ගොඩ දාගන්න මාර්ග සංවර්ධන හා මේ කටයුතු සඳහා පමණක් ප්‍රාදේශීය සභාවත්ඒ වගේම පලාත් සභාවත්  මධ්‍යම ආණ්ඩුවත් මැදිහත් වෙලා රුපියල් කෝටි විස්සකට වැඩි ප්‍රතිපාදන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අරගෙන ඇවිල්ලා තියෙනවා.ඒක  විශාල ජයග්‍රහණයක් මාස හයක් ඇතුළත මේ නිසා සමහරෙකුට පේන්න පුළුවන් මේක හරි

සොච්චම් ප්‍රමාණයක් කියලා නමුත් මේ රට අඩියෙන් අඩිය පියවරෙන් පියවර ගොඩ ගනිමින් තියෙනවා ආර්ථිකය ස්ථාවරත්වය ඇති කරමින් තියෙනවා ඒ නිසා ලැබුවාවූ මේ 2026 වර්ෂය පොහොසත් රටක් ලස්සන ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ ඉතාමත්ම කාර්යක්ෂමව වැඩ කරන වසරක් ඒ සඳහා අපේ දේශපාලන ව්‍යාපාරයත් ඒ වගේම බිම් මට්ටමේ දේශපාලන ව්‍යාපාරයේ අපේ සියලු දෙනාමත් එකම අරමුණක් වෙනුවෙන් ගොඩනැගෙන්න මේ වෙනවිට සැදී පැහැදී ඉන්නවා ඒ සඳහා අපේ බිමේ ඉන්න සියලු දෙනාමත්ඒ වගේම ගරු සභාපතිතුමා ඇතුලු  අපේ මන්ත්‍රී කණ්ඩායමත් ඒ වගේම අපිත් එක්ක සහයෝගයෙන් වැඩ කරන විපක්ෂයේ සියලුම දේශපාලන සංවිධානවල අපේ මන්ත්‍රීවරුන්ටත් ලැබුවා වූ නව වසර සුභම සුභ නව වසරක් වේවා කියල ප්‍රාර්ථනා කරමින් මීට වඩා ලස්සන රන්වැලි පුරවරයක් ගොඩ නගන්නට 2026 වර්ෂයේදී අත්වැල් බැඳගමු කියන ඉල්ලීම කරමින් මේ අවස්ථාවේ නිහඬ වෙනවා ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -පී.ඒ. චන්ද්‍රානී හේමලතා මහත්මිය</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ලැබුවා වූ අළුත් අවුරුද්ද සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාටම සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා .ඒ වාගේම ඇත්ත වශයෙන්ම අපේ අම්තිරිගල කොට්ඨාශය ගැන වචන දෙක තුනක් කතා කිරීම මට හිතෙනවා හොඳයි කියල අපේ මන්ත්‍රීතුමිය ගොඩක් දේවල් කළා .අපි ස්තුතිවන්ත වෙනවා. සංවර්ධන වැඩ කිරීම සම්බන්ධව ඇත්තෙන්ම අම්තිරිගල රෝහලේ මට මතකයි අපේ මන්ත්‍රීතුමියට මම යෝජනාවක් කළා රෝහලේ අපිරිසිදු වෙලා තිබුණා ගොඩක් ඇය සම්බන්ධව අපි සියලු දෙනා එකතු වෙලා පිරිසිදු කරලා සියලුම දේවල් පිරිසිදු කරලා  සියලු දෙනා එකතු වෙලා රෙපෙයාකරලා  තින්තගාලා රෝහල යම් තත්ත්වයකට ගෙනාවා. මොකද ගමේ සෙනඟ එකතුවෙලා තමයි ඔය රෝහල හැදුවේ ශ්‍රම දායකත්වය ඔක්කොම දුන්නේ ගමේ අය ඒ වගේම ඒ රෝහලේ තිබ්ච්ච සියලුම අඩුපාඩු ටික අපි සම්පූර්ණ කරගෙන යනවා තවත් අවශ්‍ය ටිකක් තියෙනවා ඒ ටිකත් අපි කරනවා. ඒ වගේම මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි උඩකණුගල පාර දක්වා වතුර බටලයින් එකක් දාලා තියෙනවා .තව ටික දවසක් යනකොට නිදන්ඇල්ල ප්‍රජාමූල සංවිධානය කියලා සංවිධානයක් තිබුණට ඒකේ වතුර ටැංකිය මට හිතෙනවා අවුරුද්දක් විතර යනකොට ටැංකිය ගලවගෙන යන තත්ත්වයක් තියෙනවා. ඒකට වෙලා තියෙන්නේ ජලධාරිතාව සම්බන්ධව පොඩි ගැටළුවක් තිබුනා. දැනට ඒකේ රුක් රෝපණ වැඩසටහනක් කරන්න අපි එදා කතා කළත් ඒකට අවස්ථාවක් ලැබුණේ නෑ.පරිසර සභාපතිතුමා එක්ක සාකච්ඡා කළා මොකද වටේ තියෙන අය අපේ වගකීමක් තියෙනවා ජල පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කරන්න. ඉඩම් අයිතිකාරයින් විසින් වැව්ලි කරන නිසා හෝටල් පද්ධතියක් දාගෙන ඒ වගේ කිරීම නිසා එතන අවට ප්‍රදේශය ටිකක් දූෂිත තත්ත්වයට පත්වෙනවා. ඔය වතුර ලයින් එක මට හිතෙනවා ගොඩක් පායනකොට හිඳෙනවා අම්තිරිගලට ජල ප්‍රශ්නය ගොඩක් දුරට එනවා එතකොට ඒ ජල  පෝෂිත ප්‍රදේශ ටික අපිට රැක ගන්න ගරු සභාපතිතුමනි, ඒවාගේම බට ටික දැන් දාලා තියෙනවා නමුත් ප්‍රශ්ණයක් එනවා කියල තමයි අපිට දැනගන්න ලැබුණේ ඒ ගැන හොයලා බලලා මගෙන් ගම්මු ඇවිල්ලා ඉල්ලීමක් කරනවා ජලය ගෙවල්වලට ලබාගන්න ඕන කියල නිධන් ඇල්ල එකේ ජලය පාවිච්චි කරාට පාසලේ එහෙම පිරිසිදු මදි නමුත් ඒක දැනට ගොඩක් කට්ටිය පානය කරනව ටවුම එහෙම ඉතින් ඒ හින්දා අපිට බටලයින් එක ගැන පොඩ්ඩක් තොරතුරු සොයලා බලලා නිස්සු සල්ලි දීලා ගන්න කැමතියි සභාපතිතුමනි. මට හිතෙනවා මැඩගොඩ ප්‍රදේශයේ එහෙම අපේ ධම්මික මන්ත්‍රීතුමා දන්නවත් ඇති ඒ ප්‍රදේශයේ එහෙම මුදල් දීලා වතුර ගන්නවා මිනිස්සු කැමතියි වතුරට මුදල් ලබාදීලා හරි වතුර ලයින් එක ලබාගන්න ඔබතුමාගේ කරුණික අවධානය යොමු කරලා ඒ ගැන පොඩ්ඩක් කතා කරමු කියලා මම ඉල්ලීමක් කරනවා .ඒ වාගගේම මේ ලැබුවා වූ 2026 වසරේ අපේ ප්‍රජාව වෙනුවෙන් යම්කිසි වැඩ කොටසක් කරලා ඉදිරි අනාගතය සාර්ථක කර ගනීම සඳහා අපට ධෛර්ය හා ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් ඔබ සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. අපේ සභාව ආරම්භ කරලා දැනට මාස සහයක් ගෙවිල ගිහිල්ල තියෙනවා. අපේ නව රජය යටතේ අතිගරු  ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේ රජය යටතේ ප්‍රාදේශීය

බල ප්‍රදේශයේ කොට්ඨාස දාහත සඳහා මෙතුමා සඳහන් කළ පරිදි කෝටි විස්සකට ආසන්න ප්‍රමාණයක් වියදම් කරලා තියෙනවා ආසන්න වශයෙන් මිලියන 250කටත් වැඩියෙන් මුදලක් වියදම් කරලා තියෙනවා ඒ සම්බන්ධයෙන් අපේ ගරු සභාපති දර්ශන වෛද්‍යරත්න මැතිතුමාගේ මග පෙන්වීම යටතේ අපට ව්‍යාපෘති රාශියක් කරන්න අවස්ථාව ලැබුණා.ඒවගේම අපේ සහෝදර මන්ත්‍රීවරු දෙපළ ඉන්නවා රුවිනි මන්ත්‍රීතුමිය එවගේම අපේ වහරක මන්ත්‍රීතුමා මෙතුමාගේ කොට්ඨාශ දෙක සඳහා විශාල දායකත්වයක් ලබා දුන්න ඒ ගැන ගොඩක් සන්තෝසයි. ඒ වගේම මම නියෝජනය කරන වහකුල සහ ඉදුරාණ වසන් දෙක සඳහා මිලියන පහයි දශම හතරක සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබුණා . ඒ අතරින් ගත්තොත් කවදාවත් කොන්ක්‍රීට් අඟලක්වත් දාලා නැති වතුකරයේ දෙමළ ජනතාව වෙනුවෙන් මිලියන දෙකක් වියදම් කරලා ලක්ෂ විස්සක් වියදම් කරලා පාරක් හදන්න පුළුවන් වුණා. ඒ ජනතාව අදටත් ස්තූති කරනවා සම්බන්ධයෙන් ස්තූතියි ඔබතුමාට අපේ ගරු සභාපතිතුමාටත් ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ හරහා සම්බන්ධ කරමින් මේ මාර්ගයේ ලබාදුන්නු අපේ උපසභාපති ප්‍රේම ජයන්ත ජයවර්ධන මැතිතුමාටත් මාගේ ස්තූතියි පුද කරනවා .ඒ වගේම ගරු සභාපතිතුමනි මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඔබතුමා විසින් සහයෝගයක් ලබා දුන්නා අනිවාර්යෙන් සඳහන් කල යුතුමයි .අවසාන මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය ඔබතුමා ලබා දුන්නේ ඔබතුමාට අනුමැතිය ලැබුනේ විසි නව වෙනිදා හසව එක හමාරට. වැනිදා පහුගිය දෙසැම්බර් මාසේ. ඔබතුමා ඇහුවා මගෙන් මේක කරන්න පුලුවන්ද මන්ත්‍රීතුමා කියලා. මම කිව්වා කරනව කියල පැය හතළිස් දෙකක් ඇතුලත එදාම මම අපේ සමිති සාමාජිකයො ගෙනල්ලා තිස් එක් වෙනිදා උදේ අට වෙනකොට කොන්ක්‍රීට් එක දාන්න පටන් ගත්තා. මම ඔබතුමාට ගොඩක් ස්තූතිවන්ත වෙනවා .පාර හදාගන්න මට කයි විසි නම වෙනිදා වෙද්දී ඒ අවසරය ලබාදෙන්න පුළුවන් වීම සම්බන්ධයෙන් .පැය 42 ක් ඇතුළත හැකියා සහතිකය අරගෙන ගිවිසුම අත්සන් කරලා තිස්එක රෑ අටයි කොන්ක්‍රීට් එක දාලා ඉවර වෙනකොට. ඒ සම්බන්ධයෙන් වහකුළ ජනතාව වෙනුවෙන් ඔබතුමාට ස්තූතියක් පුද කරනවා. වහකුල ගමට කිසිම ව්‍යාපෘතියක් කරලා තිබුණෙ නැහැ .එනිසා ලක්ෂ පනස්තුනක ප්‍රතිපාදන වලින් ඉඳුරන් වසමට ලක්ෂ විස්සක පාරවල් දෙකක් හදල දුන්නා.වහකුල වසමට ලක්‍ෂ නමයක පාරක් හැදුවා වතු ප්‍රජාව වෙනුවෙන් ලක්ෂ විස්සක පරම්පරාව ප්‍රාදේශීය සභාව මන්ත්‍රී ප්‍රතිපාදන වලින් වහකුල ගමේම බෝක්කු අලුත්වැඩියා කරලා පාරක් හැදුවා .ඒ විදිය තමයි මගේ කොට්ඨාශ දෙකේ වැඩ කටයුතු කරේ .වැඩ කටයුතු කරගන්න පහසු වුණේ ඔබතුමා අනුමැතිය ලබාදීලා ඒ සම්බන්ධව කටයුතු කරපු නිසයි. ඒ වගේම විශේෂ ස්තූතියක් පුද කරන්න ඕනේ මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී මහත්මිය මහත්වරු දෙපළටත් අමාලි මහත්මිය ඒ වගේම මේ සම්බන්ධයෙන් කටයුතු කරපු විශේෂයෙන් සංවර්ධන නිලධාරීතුමිය අපේ ප්‍රාදේශීය සභාවේ මහේෂි මිස් ඒ වගේම වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් ලැබුණු පාර අනුමත කර ගැනීම සඳහා විශේෂ සහයෝගයක් ලබාදුන්නාා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හකාර අධ්‍යක්ෂක නිමල් සුසන්ත එතුමාටත් මම ස්තූතියි පුද කරන්න කැමතියි. ඒ වගේම සුළු වැඩ කොටසක් අපි මේ කළේ මාස හය ඈතලත. 2026 වසරේ අපේ ඉදිරි වැඩ කටයුතු කරගන්න අපට ශක්තිය ධෛර්යය ලබා ගැනීම බලාපොරොත්තුවෙන් සියලු දෙනාටම ලැබුවා වූ වසර කිරියෙන් පැනියෙන් ඉතිරෙන්න සුබ නව වසරක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. වුලංග අනුපිය අධිකාරී මහතා</u>

ලැබුවා වූ 2026 වසර සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා මුලින්ම.කරවනැල්ල මූලික රෝහල අලුත්වැඩියා කිරීම පිළිබඳව සතුටු වෙනවා. අතාවුද සෙනවිරත්න මහතා ඉන්න කාලෙ මූලික රෝහලක් බවට පත්කරල විශාල වැඩ කොටසක් කළා.ඒ වගේම අම්තිරිගල පුස්තකාලයට ඉඩම එහෙම ලබාදුන්නේ උඩ ගෙදර සිරිවර්ධන මහත්තයා එතුමාටත් ඒ සම්බන්ධවත් විශේෂ ස්තූතියක් කරනවා. ඒක විවෘත කරලා තියෙනවා. බොහොම සතුටුයි.කරවනැල්ල මූලික රෝහලේ ඇත්තටම වෛද්‍යවරු ඇවිල්ල වටේම හොයනවා ගෙවල් ඒක හදන එකනං ඉතාම හොද වැඩක් . කරවනැල්ල ප්‍රදේශයේ ජීවත් වෙන හින්දා මම දන්නවා .ඒක හදල දෙන එක ඉතාම වටිනා දෙයක් .ඒ වගේම සභාපතිතුමනි දෙට්වා සුළි කුනාටුවෙන් හානියට පත් ජනතාවට මේ වර්ෂය තුළ ඒ අයට සාධාරණයක් කරන්නට ශක්තිය ධෛර්ය වාසනාව ලැබෙන්න ඔබතුමන්ලාට සහ රජයට ප්‍රාර්ථනා කරනවා .අපි මෙහි මොනවා කතා කළත් ඒ අයට ඒක

වේදනාවක් .ඒ අය මම හිතන්නේ ආපහු යන්න කියලා තියෙනවා හිටපු තැන් වලට. ඒ අයටත් සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් හොඳ කාලයක් ඉෂ්ට වේවා මේ වර්ෂය තුළ .ඒ වගේම ගෝනගල්දෙනිය රෝහලේ විශේයෙන්ම මම හිතන්නේ ඒ කාලේ අතාවුද සෙනවිරත්න මැතිතුමා ආරම්භ කරපු රෝහලක් මම හිතන්නේ වැඩි දියුණු කළා. ඒවාටත් විශේෂ අවධානයක් යොමු කළොත් හොඳයි .ඒ ගැනත් කතා කරමින් පාසල් යන දරුවන් විශාල ප්‍රමාණයක් තමන්ගේ පොත්පත් පවා ගන්න බැරි අවස්ථාවක් වුණා .ඒ අයටත් යම්කිසි සහනයක් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා කියමින් ඒ වගේම උදා වූ වර්ෂය රුවන්වැල ප්‍රාදේශීය සභාවට තමන්ගේ හොඳ කාලයක් දුකින් තොරව සැපෙන් බර තමන්ගේ කටයුතු ඉෂ්ට කරගන්න පුළුවන් කාලයක් උදාවේවා .ඒ වගේම සභාවේ සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාටම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට හොඳ වැඩ කොටසක් කරන්න සංවර්ධන වැඩ කොටසක් කරන්න කාලය උදාවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම දන්නොරුව ප්‍රදේශයේ නිමල් මන්ත්‍රීතුමා කිව්වා වැඩ කොටසක් කළා කියලා එතුමයි මමයි එකතුවෙලා මම හිතන්නේ විශාල විදුලි පද්ධති පාරවල් අපි දෙන්න එකතුවෙලා ඒ කාලේ කළේ .අපි දෙන්නා කතාබහ කරලා. ඒ කාලේ කළා ඒ කටයුතු කරන්නටත් ඒ ප්‍රදේශයටත් තව වැඩි කොටසක් කරන්න ශක්තිය ධෛර්ය වාසනාව ඔබතුමාට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා .බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි.සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලයටත් මාධ්‍යවේදී ඇතුළු සියලූම දෙනාට ම සුභ නව වසරක් ප්‍රාර්ථනා කරමින් මෙතුමා ප්‍රකාශ කළා වගේම අපි භාරගත්තේ ඇත්තටම කඩා වැටුණු රටක්.අවුරුදු ගණනාවක් කඩා වැටුණු ආර්ථික වශයෙන් පරිහානියට පත්වෙච්ච රටක් .මම කල්පනා කරනවා මෙම කඩා වැටීමට මම ඇතුළු දුප්පත් සාමාන්‍ය ජනතාව කිසිසේත්ම වගකීමට අවශ්‍ය වෙන්නේ නෑ. මොකද නොයෙකුත් කාරණා මත මෙම කඩා වැටීම් සහ ආර්ථික අර්බුද ඇතිවුණා. මේ බලයට පත්වෙලා සිටින්නා වූ නව රජයට මම හිතන්නේ ජනාධිපතිවරයාගේ නම දෙතුන් වතාවක් අපේ සහෝදරවරුන් මතක් කලා. එතුමා ඇතුළු අපේ මන්ත්‍රී කණ්ඩායමක් ප්‍රදේශ වාසී සියලු ම සමස්ත දේශපාලන අධිකාරියටත් පැවරී තියෙන වගකීම සහ යුතුකමක් නැවත මේ රට මන්ත්‍රීතුමා කියූ ආකාරයෙන් නගා සිටුවීම. මා වැඩිදුර කතා කිරීමට බලාපොරොත්තු වෙන්නේ නෑ.මට පසුගිය සභාව අවස්ථාවේ දී කාළ වෙලාව මදි නිසා අදහස් ප්‍රකාශ කිරීමට කාලයක් මදි වුණා . විශේෂයෙන් සිහිපත් කළ යුතුයි පැවති ස්වභාවික ආපදා අවස්ථාවේදී අපේ මහකන්ද ප්‍රදේශයේ පවුල් හැටකට පමණ පීඩාවට පත්වුණා .එම අවස්ථාවේදී අපේ රජය මගින් වියලි සලාක ආහාර ලබාදීමක් සිදු වුනා. මතක් කරන්න ඕනේ ආදරණීය ඉන්දික මන්ත්‍රීතුමා එතුමාගේ ධන පරිත්‍යාගයෙන් ඇතුළු මා ද සම්බන්ධ වෙමින් අපි ඔවුන්ට ආහාර සති දෙකක් පුරා කාලයක් ලබා දුන්නා. ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම මත සබරගමු පළාත් ආණ්ඩුකාරතුමිය ගරු චම්පා මැතිනිය විසින් අපිට එම අවස්ථාවේදී මාර්ග අවහිරතාවයක් පැන නැගිලා තිබුණු මාර්ගයක් වෙනුවෙන් විකල්ප මාර්ගයක් සඳහා රුපියල් මිලියන් තුනක ප්‍රතිපාදනයක් වෙන් කිරීමට එතුමිය නිර්දේශීය ලබා දුන්නා .එම අවස්ථාව ලබාදීමට මැදිහත් වූ අපගේ ගරු සභාපතිතුමා ඒ සඳහා මැදිහත් වූ ගරු උපසභාපතිතුමාටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙමින් ලැබූ නව වසර සියලූම දෙනාට සිතන පතන කටයුතු කරන්නට ලේකම්තුමා ඇතුළු සියලූම ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයටත්ප්‍රාර්ථනා කරමින් සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමාටත් මන්ත්‍රී මණ්ඩලයටත් ලැබුවා වූ නව වසර සියලුම සිතුම් පැතුම් ඉටුවන වාසනාවන්ත නව වර්ෂයක් වේවා කියල මුලින්ම ප්‍රාර්ථනා කරනවා.ගරු සභාපතිතුමනි පුංචි ඉල්ලීමක් කරන්න කැමතියි.ගෝනගල්දෙනියෙන් වහරක පැත්තට අපේ සුසන්ත මන්ත්‍රීතුමාගේ කලාපය. ඒ ප්‍රදේශයට යනකොටම පස් කන්දක් මීටර් පන්සීයක් විතර දුරින් පාරට වැටිලා තියෙනවා. දැන් මාසයක් දෙකක් විතර ඇති වෙනවා.එතන ඉතාම අනතුරුදායකයි. මමත් කීප වතාවක්ම වංගුවේ තියෙන්නේ අනතුරට ලක් වෙනවා .ඒ පැත්තෙන් වාහනයක් ආවොත් මේ පැත්තෙන් යන වාහනය පේන්නෙ නෑ.ඒ නිසා මම හිතන්නේ එහා පැත්තේ උඩ ගෙයක් තියෙනවා.ඒ නිසා ඒ පස් කන්දක් ඉවත්

කිරීමට කටයුතු කළා නම් සිදුවෙන අනතුරක් වළකාගන්න පුළුවන්.මොකද අනතුරක් වෙන්න ඉස්සරින් මම කියන්නේ වහරක පාරේ ඒ නිසා කන්ද ආරම්භ කරනකොටම කන්ද අවසන් වන තැන.මගේ වාහනෙත් ඉස්සරහ වැදුනා .ත්‍රීවිල් ඉතා වේගයෙන් එන්නේ .මමත් වේගයෙන් ගියා. අර පැත්තෙන් එනකොට එයාලට පෙන්නේ නෑ අපි යනවා .ඉතින් ඒක නිසා ඒක ඉවත් කිරීමට කටයුතු කරනවා නම් සභාපතිතුමනි හොඳයි, ඒ වගේම කමල් දේශප්‍රිය මන්ත්‍රීතුමා කිව්වා විශාල සංවර්ධනයක් වුණා කියලා.හැම මන්ත්‍රීවරයෙක්ම කිව්වා හොඳයි ඉතාම හොඳයි ගරු සභාපතිතුමනි මාස හයක් තුළ රුවන්වැල ආසනයේ වැඩ කරන එක ගැන අපි පක්ෂයක් වශයෙනුත් පෞද්ගලිකව මන්ත්‍රීවරයෙක් වශයෙනුත් සතුටු වෙනවා.එතුමාට එක ගමනක් මම උත්තර කතාවක් කියනකොට කිව්වා මහජනතාවගේ මුදල් අපේ මුදල් නෙවෙයි කියලා. දැනුත් මහජනතාවගේ මුදල් තමයි .සියලුම රජයන් වැඩ කළ යුතුයි. හෙට අනිද්දා අපේ ආණ්ඩුවක් ආවා .හැබැයි ඒ ආණ්ඩුව වැඩ කරන්න ඕනෙ. අපට වැඩ කරන්න බෑ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට වැඩ කරන්න බැහැ. දැන් අපි ප්‍රාදේශීය සභාව ගත්තොත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෙතන පහළොවක් ඒ පහළොවට ඔබතුමා මුදල් දුන්නොත් විතරයි වැඩකරන්න පුළුවන්.නැතුව වැඩ කරන්න බැහැ. මේ මන්ත්‍රීවරු වගේ නැගිටලා කියන්න බෑ අපි මේ වැඩේ කලා කියලා. ඔබතුමාගේ බලය අවුරුදු හතරක කාලය තුළම ඔබතුමා සභාපතිතුමා මුදල් දුන්නේ නැත්නම්මේ මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න බැහැ. ඒක අපි පිළිගන්න වෙනවා. ඒ වගේම තමයි සම්පත් මන්ත්‍රීතුමා කිව්වා මේ ආණ්ඩුව ඉතාම හොඳයි ඔබතුමා මම දැක්කා මාධ්‍යයේ ගියා විදුලි බල මණ්ඩලය විකුණනකොට එදා ඔබතුමා තමයි ඒක ගිනි තියන්නෙ .හැබැයි අද විදුලිබල මණ්ඩලය විකුණනකොට අද ඔබතුමා එදා අපි ගාව හිටියා. ඊට පස්සේ ඔබතුමා අපි ගාවෙන් ඉවත් වෙලා ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකතු වුණා. ඉතා මෑත කාලයේ දී නමුත් එදා ඔබතුමා එකතු වුණා.ඔබතුමා ගිනි තියනවා. ඒක අපි මාධ්‍ය තුළින් දැක්කා අද ඒක පෞද්ගලීකරණය කරනව හැබැයි අද මගේ ගමේ කෙනෙක් වශයෙන් ඒක හඬක් නොගැනීම ගැන මම කණගාටු වෙනවා. ගරු මන්ත්‍රීතුමා තරහට නෙවෙයි කතා කරන්නෙ. ඔබතුමා කිව්ව මහකන්දේ මම රුවන්වැල්ල ප්‍රදේශයේ ඇවිල්ල කෑමබෙදන වෙලාවේ මට ආරංචි වුණා මහකන්දේ නාය යෑමක් වුණා. මට ආරංචි උනේ ඉස්සෙල්ලම ගෙවල් දෙකයි කියල මම ඒ නිසා මොරාවත්ත ප්‍රදේශයට ආවා ඇවිල්ල ඉන්නකොට මට ආරංචි වුණා නෑ මුළු ගමම නාය යනව කියල .හැබැයි මම ඒක අතෑරලා මම ටක්ගාලා ගියා යන වෙලාවේ පවුල් හැටක් වගේ ලොකු පිරිසක් පාසලේ හිටියා .නමුත් මම ඒ වෙලාවේ කිව්වා මම දන්නවා රජයත් ඉතාම අපහසුතාවයෙන් මුළු ලංකාවේම ව්‍යසනයක් මම ගිහිල්ල කිව්වා මට ගෙවල් දොරවල් දෙන්න බැහැ සම්පත් මන්ත්‍රීතුමා දන්නවා හැබැයි කඳවුරේ ඉන්න තාක් කල් මම ඔබතුමාල බඩගින්නෙ තියන්නේ නැහැ .මම කන්න දෙනවා කියල එහෙම ශක්තියක් මට තියෙනවා. ඒක ආණ්ඩුවටත් හොඳක්. හැබැයි මට කෑම දෙන්න පුළුවන් වුණේ දෙපාරක් වගේ.මම ව්‍යාපාරිකයොත් එකතු කරගෙන දුන්නා හැබැයි මම ආඩම්බර වෙනවා ගමේ අය අල්ලපු ප්‍රදේශවල්වල අය ඒ කට්ටිය යනතුරු ඒ ආහාරපාන ලබල දුන්න ඒක තමයි ගමේකම හිතවත්කම මනුස්සකම ඒක ඉස්මතු වෙලා තිබුණා මහ කන්ද ප්‍රදේශයේ ඒ වගේම රුවන්වැල්ල ආසනයේ දැන් අද කීප දෙනෙක් යනවා හැබැයි ගරු සභාපතිතුමනි, කණ්ඩායමක් ඉවත්වෙලා ඉන්නවා. ඒ කට්ටියට එන්න කියලා තියෙනවාද වැඩිය වැස්සොත් නැවත ඉවත් වෙන්න කියලා තියෙනවා නැත්තම් ඉන්න කියල තියෙනව.මේ කට්ටිය ඇත්තටම ගරු සභාපතිතුමනි කොහොමද එහෙම වෙන්නේ ලොකු ප්‍රශ්නයක් ඒ කට්ටිය අදටත් ඉවත් වෙලා මම හිතන්නේ නිට්ටඹුව ප්‍රදේශයේ ඥාති ගෙවල්වල ඉන්නව.වහින්නැති වෙලාවට ගෙදරට එන්නත් වහින වෙලාවට දුවන්නත් වෙනවා. පෙළක් අය අසනීප තත්ත්වයෙන් යන්න එන්න බැරුව ගෙදරක හිටිය අවුරුදු අනූ දෙකක් උඩ කුරුනේ ගෙදර ගරු සභාපතිතුමනි හිටිය අවුරුදු අනූ දෙකක් ගෙදර ඉඳලා ගෙදරින් ගෙනහිල්ලා හරියටම සතියයි එයාගේ පුතාගේ ගෙදර මිය ගියා. අවුරුදු අණූ දෙකක් මහගෙයි හිටියේ. සම්පත් මහත්තයා දන්වා. ඒ නිවස මාරු උනා විතරයි මිය ගියා .ගම්පහ ප්‍රදේශයේදී ඉතින් ඒක නිසා ඒ ආතා ඉන්නවා නැවත ගෙදරට තාම ඇවිල්ල නෑ. එන්න යන්නේ හැබැයි ආයෙ වහිනකොට ඒ ආත උස්සගෙන ආපහු දරුවාගේ ගෙදරට යන්න වෙනවා අපි යන්නැති හින්ද අපිට සතුටක් වෙන්න පුළුවන් ඒ අය ගැන අපි මොන විදිහක ද බලන්නෙ ක්‍රමවේදයක් තියෙනවාද. ගෙවල්වල කට්ටිය අසරනතාවයකට පත්වෙලා ඉන්නවා. ඒ නිසා ඒ ගැනත් බලන්න මේ වර්ෂයේදී ඔබතුමාලට ඊට වැඩිය වැඩ කොටසක් රුවන්වැල්ල ප්‍රදේශයට ඔබතුමන්ලාගේ රජය යටතේ කරන්න දවතින්ම ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.ස්තුතියි.

<u>**ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා**</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.විශේෂ අවසරයක් ඉල්ලා සිටිනවා මම මේ වෙලාවේ.මාගේ පෞද්ගලිකත්වයට හානියක් වෙනවා මෙතුමා දැනගෙන හෝ නොදැන. මෙතුමා ප්‍ර කාශ කළ අන්දමට විදුලි සේවක සංගමය ජනතා විමුක්ති පෙරමුණ සමඟ සම්බන්ධ සබරගමු පලාත් විධායක සභිකයෙකු ලෙස මම එදා අපේ ආදරණීය රංජන් ජයලාල් සහෝදරයා දැනට කඩුවෙල මහ නගර සභාවේ නගරාධිපතිතුමා සමඟ ගිනි තිබ්බ සංකේතාත්මකව පනත. මෙතුමා කිව්වා ආකාරයට ඇත්තටම ලංකා විදුලිබල මණ්ඩලය විකිණීමක් පෞද්ගලික කිරීමක් සිදුවන්නේ නැහැ ඔබතුමාලට අපගේ උපාලි මන්ත්‍රීතුමා නිතරම අන්තර්ජාලය හා තොරතුරු සම්බන්ධ කරන ඇත්තටම ඔබතුමන්ලාට මේ ගැන මේක විනාඩි දහයෙන් කියන්න පුළුවන් කතාවක් නෙවෙයි ඒ ගැන කරුණු පරිචය කරන්න පුළුවන් මේක රාජ්‍ය සමාගම් හතරකට තමයි ඇත්තටම පැවරෙන්නේ ලංකා විදුලි බල මණ්ඩලයේ කිසිසේත්ම විකිණීමක්වත් සේවකයින්ගේ වරප්‍රසාද අහිමි කිරීමක්වත් සිදු වෙන්නේ නැහැ ඒවගේම තමයි මාගේ උපතේ වෙන්න 1989 මම ඕලෙවල් විභාගයෙන් පස්සේ ලංකා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්නේ .‘මෙතුමාගේ කිව්වා මෙතුමාගේ ගොඩේ  හිටියා කියලා. ඇත්තටම ඉන්දික මන්ත්‍රීතුමා මාගේ පවුලේ තියෙන ක්‍රමවේදයත් එක්ක මාගේ පියා මාගේ මව මම එතකොට මුලින්ම ලංකා විදුලි බල මණ්ඩලයට සේවයට ගියේ රුපියල් 450ක වගේ මැන් පවර් සේවකයෙක් වශයෙන්. එතකොට මගේ පියත් මාගේ සහෝදරයත් මෙතුමා සමග ක්‍රියාශීලීව වැඩ කරද්දි මට එතුමා හා සම්බන්ධ වීමක් ඇත්තටම සිද්ධ වුණා. නැතුව මාගේ ක්‍රියාකාරී දේශපාලනය මා සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු ජනතාව විමුක්ති පෙරමුණට සම්බන්ධව කටයුතු කළා මෙතුමා පුද්ගලිකව මෙතුමා කියන්නා වගේ මඩ ගැසීමක් නෙවේ .එතුමා ආරක්ෂා කිරීම වෙනුවෙන් පක්ෂ දේශපාලනයකින් තොරව සෑම වෙලාවකදීම පෙනි සිටියා බොහොම ස්තූතියි.

<u>**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**</u>

බොහොම සංවේදී කථාවක් කලා ගරු ඉන්දික මන්ත්‍රීතුමා .යම් තැනක තමන්ගේ  ස්ථානීය ආලය තැනක ජීවත් වෙනවා නම් ඒ කෙනෙක් එතනින් අයින් උණට  පස්සෙ ඇත්තටම පීඩාවට පත්වෙනවා. ඒ වෙනුවෙන් තමයි අපි විශේෂ අදහසක් අරන් තමයි මේ කටයුත්ත කරන්නේ ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් වෙනම කතා කළා. අපි දන්නවා පහුගිය කාලසීමාව තුළ කිව්වා වගේම කිසිම ගෙවීමක් කරපු නැති තැන් තියෙනවා . මේවා පිළිබඳව හොයලා බැලූවෙ නෑ. කියන කාරණේ අපේ මේ කියන්නෙ. මේවා මහජන මුදල් තමයි. අපි කියන්නෑ අපේ දේවල් කොහෙවත් වියදම් කරනවා කියලා. එක තමයි අපේ එක පොටෝ එකක්වත් කොහෙවත් තැනක ගහල නැත්තෙ? අපි ඒක නමක් කොහෙවත් සඳහන් වෙන්නේ ේ නැත්තේ අපි කරා කියලා .පහුගිය කාලේ දැක්කනේ හදපු හැම තැනම දාලා තියෙනවා තමන්ගේ නම සහ මුණත්තහඩුව දාපුව තමයි අපි දැක්කේ .එහෙම ඒවා එක තැනකවත් අපේ ඒවා නැහැ .අපි එහෙම සඳහන් කරන්නේ නැහැ. පෙළක් තැන්වල අපේ ෆොටෝ එක දාලා ගහන්න හදනවා මගේ ෆොටෝ එක ඉල්ලනවා මම කිව්වා කීයටවත් දෙන්නේ නෑ .ඒවා කරන්නත් එපා කියලා අපිට එහෙම උවමනාවක් පහත් මානසිකත්වයක් අපේ නෑ. එ එනිසා අපේ කරගන්න කිසිම තැනක මේ වැඩකටයුත්ත කරල නෑ කරන්නෙත් නැහැ .ඒ වගේම තමයි තමන්ගේ ගෙදර අහිමි වෙච්චහම ඒ දැනෙන වේදනාව අපි දන්නවා .හැබැයි ප්‍රශ්නයක් තියෙනවා අපිට ක්ෂණිකව ඒ පදිංචි කරපු තැන්වලින් අයින් කරන්න පුළුවන්කමක් නැහැ. පෙළක් පදිංචි කරපු තැන් තියෙනවා පහුගිය කාලෙ ඉඩම් දීලා ඇත්තටම සත්තු ඉන්න තැන්වල තමයි සත්තු ඉන්න තැන්වල තමයි මිනිස්සු පදිංචි කරලා තියෙන්නේ .මිනිස්සු ඉන්න ඕන තැන්වල නෙවෙයි මිනිස්සු පදිංචි කලේ උදාහරණයක් කියන්නම් සිසිරගම කියලා ඉඩම් දීල තියෙනවා. ගලපිටමඩට පොඩ්ඩක් මෙහායින්. ගෙවල්වල මිනිස්සුන්ට ජීවත් වෙන්න පුළුවන් තැන් නෙමෙයි ඇත්තටම. ඒ මිනිස්සු තාමත් ඡන්දෙ දෙනවා අපට ඉඩම් දුන්නා කියලා. ඉඩම් දීලා තියෙන්නේ කොහෙද කියලා පොඩ්ඩක් කල්පනා කරලා බැලුවොත් ඇත්තටම සත්තු ඉන්න ඕන තැන්. සමාජයක් හදල තිබුණේ මේක දැන් අපි වෙනස් කරන්න ඕනේ කියන්නෙ ඒකයි ක්ෂණිකව අවුරුද්දෙන් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. දැනට ජනාධිපතිතුමා හඳුනාගෙන තියෙනවා වාර්තා අනුව දැනට හඳුනාගෙන තියෙනවා විසිදාහක් නිවාස හානි සිද්ධවෙලා තියෙනවා අර්ධ හානි වෙලා තියනවා හයදාහකට අර්ධ හානි කියන ගණයට ගන්නව හයදාහක් ඉතුරු අටදාහක් සම්පූර්ණයෙන්ම අලුතෙන්ම ගෙවල් දෙන්න වෙලා තියෙනවා ඒගොල්ලො නැවත ඒ ස්ථානයේ පදිංචි කරන්න බැරි විදිහට විනාශයක් වෙච්ච .අය ඒගොල්ලන්ට කෝටියක මුදලක් දෙනවා ඉඩමට දෙනවා ඊට අමතරව නිවාස හදාගන්න දෙනවා හැබැයි මේක ගැන අපි සන්තෝස වෙන්න ඕනෙ

.අපි ඒක ගැන ඇත්තටම පරණ විදිහේ සැකයකින් හිතන්න පුරුදු කරල තියෙන එක සාධාරණයි අපේ සමාජයට. දීපු පොරොන්දු එකක්වත් එදා ඉෂ්ට කරල නැහැ. ඒ නිසා මිනිස්සු තුළ තියෙන්නෙ සැකයක්.මේක වෙයිද නැද්ද කියල හරියට දන්නේ නැහැ. එතකොට ඒ සැකය වර්තමානයේත් මේ සමාජ ක්‍රමය ඇතුලෙත් හදන්න හදන්නේ. එදා සමාජය නෙමෙයි අද තියෙන්නේ මේක වෙනස් කරලා තියෙන්නේ .මේ සැකය හදන්න එපා. මේක ඇත්තටම වැරදියි. එහෙම කරන්න එපා. මේ දෙන්න හදන්නේ අවංක උවමනාවකින් මේවා අපේ සල්ලි නෙවෙයි. ඉන්දික මන්ත්‍රීතුමා ඔබතුමා කිව්ව වගේ. අපේ සල්ලි නෙවෙයි මේ මහජනතාවගේ දේපල බදු මුදල් ඒ බදු මුදලින් එකතු කරගත්ත මුදල් සාධාරණව බිමට ගලාගෙන යන ක්‍රමයක් හදල තියෙනවා.ඒ ක්‍රමය තමයි මේ හදලා තියෙන්නේ. ඒ ඇරෙන්න අපි වෙන මොකක්වත් අපේ නම ගහගන්න කරලා නැහැ. අපි මේ ඡන්දය බලාගෙන නෙවෙයි කරන්නෙ. ඇත්තටම මේක මිනිස්සු වෙනුවෙන් දෙන්නේ මම මේක එදත් කිව්වා මගේ කොට්ඨාශය තුලින් රුවන්වැල්ල ආසනය තුළ ගෙවල් දහතුනක් දුන්නා. ලක්ෂ දහය ගානෙ ගෙවල් හදා ගන්න දහතුන් දෙනෙකුට දුන්නා .ඔය එක ගෙයක්වත් අපිට ඡන්දෙ දෙන අය නෙමෙයි. ඊට අමතරව දැන් සමෘද්ධියෙන් ගෙවල් තුනකට සල්ලි වෙන් කරලා තියෙනවා.ඒකේ පොඩි ප්‍රමාදයක් වෙලා තියනවා. නමුත් ලක්ෂ එක හමාරක් දැනට පොතට දාපුවත් තියෙනවා. ඒක හෝල් කරල තියනවා .ඒවවත් අපිට ඡන්දෙ දෙන අය නෙමෙයි.හැබැයි අපි ඒක දෙන්න කියලා තියෙනවා.ඒ වගේම විදුලි බල මණ්ඩලේ ගැන කියපු කතන්දරය විදුලි බල මණ්ඩලය කිසිසේත් විකුණන්නේ නැහැ. විදුලි බල මණ්ඩලය විතරක් නෙමෙයි විකුණන්න ලැස්ති කරලා ඇවර කරන්න ලැස්ති කරල තිබුණු ආයතන නැවත අපි ගත්ත .එකක් hiland milko සමාගමක් විකුණන්න ඇවර කරලා තිබුණු සමාගම බෝනස් ගෙව්ව .විදුලිබල මණ්ඩලේ අවුරුදු ගාණක් බොන ගෙවන්නැතුව තිබ්ච්ච එක බෝනස් ගෙව්වා.හැබැයි අපේ මන්ත්‍රීවරු කාටවත් හම්බ වුණේ නැහැ. නිවාඩු හින්දා මේගොල්ලෝ තමයි සටන් කලේ. අපේ මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා.දෙන්නටම හම්බවුනේ නැහැ .සටන් කළේ ඒ ගොල්ලෝ. ගුවන් සමාගම පාඩු ලබල තිබුණු ආයතන. අද මොකද කරන්නේඅද ඒක තාමත් පාඩුවට තිබුණත් විකුණන්නෙ නැහැ. ඒක ලාභ ලබන තත්ත්වයට පත් කරන්න පුළුවන්.ඒවා වංචා දූෂණය නාස්තිය හොරකම නැවැත්තුවානම් මේවා හොඳ තැනකට ගේන්න පුළුවන්. ඒක ඇත්ත ඒක පිළිගන්න වෙනවා. මේ රට හැදුනොත් හැදෙන්නෙ අපේ අයට විතරක් නෙවෙයි.සමස්ත අනාගතය වෙනුවෙන් රට හදන්නේ.එහෙනම් මේ සමාජය වෙනුවෙන් අපි මහන්සි වෙන්නේ.මේ හදාගන්නේ අපි අනාගත පරපුර වෙනුවෙන්.මම හිතන්නෙ ඒක ඇත්ත හෘද සාක්ෂියක් තියෙනවා නම් ඕක කියවෙන්න ඕනෙ. අපි මේ බොරුවට උඩ තියෙන කාගෙවත් දේශපාලන මතවාදයක් පෝෂණය කරන්න බිම ඉඳල දඟලනවනං ඒක විතර මෝඩ කමක් වෙන නැහැ.වෙන මොකක්වත් නෑ අපේ අරමුණු එකයි. හොඳ සමාජයක් හදන්න හොඳ රටක් හදාගන්න දුක් විඳින්නැති සමාජයක් හදාගන්න දැන් මේ විනාශය සුනාමිය හා දහගුණයකට වැඩිය වැඩියි.දෙන්න හදන දීමනා ආධාරා වන්දි ඉතිහාසයේ කවදාවත් නොකරපු දේවල්.ඒ දෙන්නේ මිනිසුන්ගේ සල්ලි.අපේ සල්ලි නෙවෙයි.මේ රටේ ඉන්න මිනිස්සු එකතු කරපු මේ සල්ලි එදා මහා භාණ්ඩාගාරයට කෙළින්ම ආව ඒවා කෙලින්ම ආවේ නෑ.මගින් හැරුණ වෙන වෙන දිහාස් වලට දැන් මේ සැරේ මහා භාණ්ඩාගාරයට කෙලින්ම එනවා.එකතු වෙනවා.මහා භාණ්ඩාගාරය පිරිලා තියෙනවා ඒ හින්දා කියන්න වෙලා තියෙනවා සමහර අයට. ඒ නිසා එතනට ඇවිල්ල තියෙන්නෙ .එකක් හිතේ තියාගෙන එකක් කියන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරනවා බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා</u>

ගරු සභාපතිතුමනි.විශේෂයෙන්ම ලැබුවා වූ සුභ අලුත් අවුරුද්ද සභාපතිතුමාට උපසභාපතිතුමාට සෙසු සියලු මන්ත්‍රීතුමන්ලාට බොහොම වාසනාවන්ත එකක් වෙන්න ඕනෙ කියල ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම අපේ සුභසාධක සමිතිය මේ අවුරුද්දේ පිහිටවල සුභසාධක සමිතියෙන් උපසභාපතිතුමා මුල් කරගෙන අපේ හිතවත්කම් තහවුරු කරගමු ශක්තිමත් කරගමු කියලා ඉල්ලීමක් කරනවා.ඒ වගේම මම අද විශේෂයෙන් සඳහන් කරන්නට ඕනේ 1987 කරවරනැල්ල මූලික රෝහල ස්ථාපිත කරල තියෙන්නෙ සුද්දෝවතු රෝහලක් විදියට. පසු කාලීනව සමාජ මාධ්‍ය හරහා ලොකු චෝදනාවක් එල්ල වුණා මේක කන්දක් උඩ තියෙන්නේ රෝගියෙක් ගෙනියන්න බැහැ එහෙම කියල.නමුත් ගංවතුර මේකට හොඳම සාක්ෂිය.කරවනැල්ල වටේටම යට වෙද්දී කරවනැල්ලේ ඉස්පිරිතාලේ අය තමා ඉස්පිරිතාල භූමියට තමයි

අර ඔක්කොම රොක් වෙලා ආරක්ෂාව පතන්නෙ.සුවිශේෂී සිදුවීමක් එතකොට දැන් අවුරුදු එකසිය තිස් නමයක් පරණයි.රෝහලේ අද බාහිර රෝගීන් තුන්සියයක් හාරසීයක් පමණ ප්‍රමාණයක් දිනකට ප්‍රතිකාර ලබනවා .මේකේ නේවාසික රෝගීන් ඉන්නවා සීයක් එකසීය පනහක් අතර දිනපතාම.ඒවාගේම සතියේ දිනවල විශේෂ සායන හැම සතියකම පැවැත්වෙනවා.හත්සිය පනහක් දාහක් අතර ප්‍රමාණයක් සායනවලින් ප්‍රතිකාර ලබනවා.මීට අමතරව තුවාල වලට විතරක් තුන්සියයක් පමණ බෙහෙත් දානවා දවසකට.ඊට අමතරව මාසෙකට ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් මේකෙන් ප්‍රතිකාර ගන්නවා කියන්නේ අවුරුද්දකට ලක්ෂ දොළහක් කරවනැල්ල රෝහලෙන් ප්‍රතිකාර ලබනවා.එනිසා වාසනාවට අපිට ලැබිච්ච තුන් කෝරළයේ සම්පතක්.දැන් අද අලුත්ම තත්ත්වය යටතේ මේ ප්‍රදේශයේ තියෙන පොඩි රෝහල් දාහතක් පාලනය කරන්නේ කරවනැල්ල රෝහලින්. ගෑස් නැත්නම් බෙත් නැත්නම් වෙනත් දේවල් නැත්තං කරවනැල් රෝහලින් තමයි සැපයුම් කරන්නේ.ඊ ගාවට ලොකුම සම්පත තමයි ගරු සභාපතිතුමා සඳහන් කරපු විදිහට සීටි ස්කෑන් එකක් කෑගල්ල රෝහල ඇරුනහම තියෙන්නේ කරවනැල්ලෙ.හැටන් නවලපිටිය අයත් එන්නේ කරවනැලට. අපි දෙවෙනි වෙන්නේ කෑගල්ලේ රෝහලට පමණයි. ඒ ශ්‍රේණියේ රෝහලක් කරවනැල්ල කියල කියන්නේ .මේකේ වැඩිදියුණු කරගන්න ගොඩ නඟාගන්න මේ සියලු දෙනාම පුළුවන් කාලසීමාවන් වලදී ලොකු කැපකිරීම් කරලා තියෙනවා අපි ඉතාමත්ම අගය කරනවා ඒ කැපවීම් නමුත් මම කියන්න උත්සාහ කරන්නේ මේකේ තියෙන එක්තරා අයහපත් පැත්තක් ගැන.වෛද්‍යවරු ඉන්න ඕනි එකසිය පනහක්. ඉන්නෙ එකසිය දහයයි.වෛද්‍යවරු හතළිහක් හිඟයි.මේකේ ඉන්න ඕනෙ හෙද කාර්ය මණ්ඩලය දෙසිය හැටයි අද මේ වෙනකොට ඉන්නේ එකසිය අනූ දෙකයි.එතකොට හැට දෙනෙක් හිඟයි. මේකෙ බරපතලම සිද්ධිය තමයි කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය දෙසිය හැටපහක් ඉන්න ඕනේ 2025 කාඩර් එක අනුව. මේකෙ ඉන්නෙ එකසිය හැටයි. එකසිය පහක් විතර අඩුයි ඉන්න කාර්ය මණ්ඩලය ලොකු කැපවීමක් කරන්නේ කරවනැල්ල රෝහලේ මෙය පවත්වාගෙන යන්න. එතකොට මේකේ විශේෂඥ වෛද්‍යවරු විතරක් දාසය දෙනෙක් ඉන්නවා.කෑගල්ලේ මම හිතන්නෙ විස්සයි අපේ දාසයක් ඉන්නවා හරිම වැදගත් ඒගොල්ලන්ට නේවාසික ගොඩනැගිල්ල තනා දීම.දක්ෂ රෝහල් අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. රටේ විගණකාධිපති නැතුවා වගේ මේකේ අධ්‍යක්ෂක කෙනෙක් නැහැ.වැඩ බලන කෙනෙක් ඉන්නවා. හැබැයි ඒ සියලු වගකීම් කරට අරගෙන දැඩි කැපවීමකින් එයාට එක දෙයක් තියෙනවා එයා මේ රුවන්වැල්ලේ මනුස්සයෙක් එයාට තමන්ගෙ එකම ගමේකම අහල පහලකම මේ සියල්ලම ඕනකම තියෙනවා.ඒ නිසා අහක යන වගකීමක් කරේ තියාගෙන රෝහල් අධ්‍යක්ෂකතුමා මේ රෝහල ආරක්ෂා කරන්න ලොකු කැපවීමක් කරනවා .බලන්න හෙදියෝ හැටඅට දෙනෙක් අඩුයි කියලා කියන්නේ මේක කවර් කරන්න හැම හෙදියක්ම සේවා මුර පහළොවක් ඒ කියන්නේ රාත්‍රී සේවා මුර පහළොවක් කරනවා සමාජ සහ නොයෙකුත් ප්‍රශ්න ගෙවල්වල ඇතිවෙන්න මූලික හේතු සාධකයක් වෙනවා. මානසීක ආතතිය මනුෂ්‍යයෙ ප්‍රශ්න මේ සේවකයින්ට වැඩිවෙලා තියෙනවා.මේකේ කාර්යභාරය බාහිරව සම්පත් කොච්චර එකතුකරත් මානව සම්පත්ත ප්‍රමාණවත් නොමැති නම් කරවනැල්ල රෝහලට ලැබෙන්නේ නැත්නම් අපි බලාපොරොත්තු වෙන සේවාව යම් තරමක බිඳ වැටීමක් තියෙනවා. මේ රෝහලේ සුළු කාර්ය මණ්ඩලය අද උදේ වැඩට ඇවිත් අද රෑත් වැඩ කරල හුවෙනිදා තමයි ගෙදර යන්නේ.මේ වගේ ලොකු ප්‍රශ්නයක් මේ කරවනැල්ල රෝහල ඇතුලෙත් අපි දකිනවා.මේක අපි පැහැදිලිවම කියනවා සබරගමු පළාත් සභාව තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ සහ රත්නපුර දිස්ත්‍රික් දෙකේම ඕන තරම් අතිරික්ත හෙද කාර්ය මණ්ඩලේ ඉන්නවා සුළු සේවකයො ඉන්නවා රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු කාර්ය මණ්ඩලය අතිරික්ත තුන්සියයක් ඉන්නවා හෙද නිලධාරි කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ඉන්නවා රෝහලේ විතරක් වැඩිපුර පහළොවක් අතිරික්ත 15ක් ඉන්නවා.අපි මේක කියන්නේ තුලනය කරන්න තුලනය කරලා අලුතෙන් සේවකයෝ බඳවා ගන්න හෝ වෙනත් කාර්යභාරයකට යන්න කියනව නෙවෙයි අපේ රෝහල ආරක්ෂා කරගන්න අවශ්‍ය සේවකයින් ගෙන්න ගන්න අපිට ඕනකම තියෙන්නෙ සේවකයෝ මේක තුලනය කරලරෝහලට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබාදෙන්න කියන එකයි ඉතින් මේක තුලනය නොකළොත් ආයතන ප්‍රධානීන්ටත් වගකීමක් තියෙනවා අනවශ්‍ය සේවකයෝ රඳවාගෙන ඉන්න බැහැ ඉතින් මේ මොන පදනමක් මත රඳවාගෙන ඉන්නවද කියන එක තමයි ඊළඟ ප්‍රශ්නය හිතෙන්නේ. ඒ නිසා මේක සබරගමුව පළාත් සභාව විශේෂයෙන්ම ඇයි මේ කුඩම්මාගේ සැලකිල්ල කරවනැල්ල රෝහලට සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිදු කරන්නේ කියන එකයි අපිට තියෙන ගැටළුව. මෙච්චර ලංකාවේ එකම රෝහලක්වත් නෑ මෙච්චර සේවකයින් අඩුවෙන් මේ විදිහට පවත්වාගෙන යන

එකක්. මේක තමයි එකම රෝහල් ලංකාවේ ඒ නිසා මේ තත්වය ජනවාරි තිස්එක් වෙනිදා වෙනකොට සම්පූර්ණ කරේ නැත්නම් මේක ලෙඩ්ඩු මැරෙන්නෙ අපේ ලෙඩ්ඩු අසරණ වෙන්නේ තුන්කෝරළේ ලෙඩ්ඩු .මේ සියල්ල ගැන සැලකිල්ලට අරගෙන අපි බලාපොරොත්තු වෙනවා සබරගමු පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට විරුද්ධව මානව කොමිෂන් එක හරහා පැමිණිල්ලක් යොමු කරන්න .ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නේ සභාවෙන් ගරු ඉල්ලීමක් කරන්නේ ආණ්ඩුකාරතුමියගේ විශේෂ ඉල්ලීමක් කරලා මේ රෝහලේ තියෙන සේවක හිඟය සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න සුළු සේවකයෝ විතරක් එකසිය පහක් නෑ .වෛද්‍යවරු විතරක් හතළිහක් නෑ. හෙද නිලධාරිනින් හැට අටක් නෑ. එතකොට මේ ආයතනය පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා මේ කුඩම්මාගේ සැලකිල්ල මෙතනින් ඉවත් කරලා දිස්ත්‍රික්කයේ හොඳ රෝහලක් බවට කරගෙන යන්න පුළුවන්කම ලැබෙනව අර විදිහට කටයුතු කළොත් .මුන්නාන්සේලාට සුභ අනාගතයක් වාසනාවන්ත අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් විශේෂයෙන් සුළු වෙලාවක් ඉල්ලනවා. මේ ප්‍රදේශයේ කෘෂිකාර්මික පැත්තෙන් ලොකු සංවර්ධනයක් කිරීමේදී ගොවිජන සේවා නියෝජිත කොමසාරිස් මුදිතා වීරසේකර මැතිණිය ලොකු සේවයක් සිදුකළ ගොවිජන බැංකු ව්‍යාපෘති ව්‍යාපාරයේ ආරම්භ කිරීම සිතමු ගොවි සංවිධානයේ රම්භ කිරීම ගොවි සංවර්ධන මධ්‍යස්ථාන අරමුදලක් ඇති කරලා රජයෙන් දෙන්නේ නෑ ගොවීන් ජන සේවා මධ්‍යස්ථානවලට ටෙලිෆෝන් බිල් දෙන්නේ නෑ.සංවර්ධන අරමුදලක් ඇති කරලා මේ වගේ යෝධ ව්‍යාපාරයක් ඉස්සරහට ගෙනියන්නට ලොකු කැප කිරීමක් කරපු චරිතයක් එතුමිය අවුරුදු තිස් එකක සේවා කාලයෙන් පස්සේ ගිය සතියේ විශ්‍රාම ගත්තා. අපි එතුමිය සේවයට ගියේ හකකාර ප්‍රාදේශීය නිලධාරියක් විදිහට කෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙලා ඊළඟට ගොජන සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරි වරයෙක් හැටියට ඉඳල පසුගිය සතියේ විශ්‍රාම ගියා ඒ විශ්‍රාම ජීවිතය අසාර්ථක වේවා කියලා තමුන්නාන්සේලා සියලු දෙනා වෙනුවෙන් ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි

**<u>ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි.මම හිතන්නෙ මේ 2026 වසරේ පළවෙනි සභා රැස්වීම. සියලු දෙනාටම සුභ නව වසරක් වේවා කියල ප්‍රාර්ථනා කරනවා.සහෝදර සහෝදරයින් සියලු දෙනාටමත් ඒ වගේම ප්‍රාදේශීය සභාවේ වැඩ කරන ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.ඒවගේම ස්තුතියක් කරන්න ඕනෙ. 2025 වසරේ සංවර්ධන යෝජනා කඩිමුඩියේ ආවේ.එකක් අපි මේවා ඉගෙන ගනිමින් හිටියේ. සියල්ල කාර්යක්ෂමව කරගන්න අපේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ ඉතාමත්ම කැපකිරීමක් කළා.ඒ පිළිබඳවත් අපේ ස්තුතිවන්ත වෙන්න ඕන.ඒ කාර්ය මණ්ඩලයට ඒ වගේම කරවනැල්ල රෝහල සම්බන්ධයෙන් මන්ත්‍රීතුමිය පුෂ්පකාන්ති මන්ත්‍රීතුමිය එලදායි යෝජනාවක් ගෙනාව.අපි ඒවා ක්‍රියාත්මක කරමු.ඒ වගේම මේ රෝහලේ ගැටළු ටිකක් සම්බන්ධයෙන් අපේ හිතවත් රත්නපාල පීරිස් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. අපි දිගින් දිගටම මේ සම්බන්ධයෙන් සාකච්ඡාවට ගණනාවක් කළා.පරිසර ඇමතිතුමා මැදිහත් වෙලා සාකච්ඡාවට දෙකක් විතර කළා කෝසල සහෝදරයා ඉන්නකොට එතුමා මැදිහත් වෙලා සාකච්ඡාවක් කළා.එතකොට ඔය සීටී ස්කෑන් යන්ත්‍රය ක්‍රියා විරහිත වෙලා තිබුණේ.කොහොමහරි කෝසල සහෝදරයා මැදිහත් වෙලා ඒක රෙපෙයාර් කරලා දුන්නා වැඩකරන තත්ත්වයට ගෙනාවා. ඊට පස්සේ මෙන්න මේ පිරිස් සම්බන්ධ ගැටලුව ඉතා සංකීර්ණ එකක් අපිට සේවකයෝ බඳවා ගැනීමේ සීමාවක් තියෙනවා.අනුමත කර ගැනීමේ ප්‍රශ්න තියෙනවා. ව්‍යුහාත්මක ගැටලු බඳවා ගැනීම් වලටත් වඩා තියෙනවා. ප්‍රශ්නය කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කාඩර් එක පිරිලා තියෙන්නේ. අලුතෙන් බඳවා ගන්න බැහැ .නියමිත සේවක සංඛ්‍යාව ඉන්නවා .හැබැයි ඉන්නෙ කොහේද ඉන්නේ කෑගල්ල පැත්තේ .ඒ පැත්තෙන් තමයි සෞඛ්‍ය ඇමතිවරු වැඩියෙන් හිටියේ .මහ ඇමතිතුමා හිටියේ. ඒ පැත්තෙන් රඳවා ගැනීම් කලේ .එතකොට එයාලා රාජ්‍ය සේවයේ කිසියම් කාලයකදී දුෂ්කර සේවා කොන්දේ සිටු කරලා ඒ පැත්තට ගිහිල්ලා ඉන්නවා. එහේ අතිරික්තයක් තියෙනවා. අතිරික්තය ගලවා ගන්න ගියාමත් ලේසි නෑ .රාජ්‍ය කළමනාකරණයේ දී ඩිවුටි අරගෙන යන්න පුළුවන් වුණත් හිඟය පෙන්නනව. හැම රාජ්‍ය ආයතනයකම එහෙම තත්ත්වයක් තියෙනවා. ඒකට අපි විසඳුමක් විදිහට හෙද කාර්ය මණ්ඩලය අනුයුක්ත කරා මාස තුනෙන් තුනට රොටේට් හදලා.කාලයක් යනකොට කරන්නේ

රජයක් විදිහට 2026 වසරේ දී මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කරවනැල්ල රෝහල පිළිබඳව ඇතිවෙලා තියෙන මේ පිරිස් බල ප්‍රශ්නය ඉතා කඩිනමින් විසඳන්න මැදිහත් වෙනවා මැදිහත් වෙමින් තියෙනවා. යෝජනා ගෙනාවා අනුයුක්ත කිරීම් කළා. එතනින් එහාට ස්ථිර විසඳුමකට යන්න ඕනේ. රෝහල් අධ්‍යක්ෂකතුමා පත් කර ගැනීම සම්බන්ධයෙන් අපි රජයක් විදිහට විධිමත් ක්‍රියාවලියකින් පත් කිරීම වෙන්නේ එතුමා දැනට වැඩ බලන අධ්‍යක්ෂවරයෙක් තමයි.නියමිත පටිපාටියට අනුව එතුමා අධ්‍යක්ෂක කෙනෙක් හෝ ඒ සම්බන්ධයෙන් අපිට මැදිහත්වීම වෙන්න බැහැ. එතුමා නමුත් ඉතාම කැපවීමෙන් ස්ථිර රෝහල් අධ්‍යක්ෂක කෙනෙක් නොවුනට ඊටත් එහා ගිහිල්ල ඉතාම හොඳින් වැඩ කරනවා. ඒ පිළිබඳවත් අපි අපේ ප්‍රණාමය එතුමාට පුද කරනවා.ඔන්න ඔය තත්ත්වය තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පවතින තත්ත්වයන්.ඉක්මනින්ම පිරිස් බල ගැටලුව විසඳන්න කටයුතු කරනවා.ආණ්ඩුකාර තුමියත් එක්කත් සාකච්ඡාවක් ගම්මු. සාකච්ඡාවක් ගත්තත් ආණ්ඩුකාරතුමිය මේක ප්‍රශ්නය දන්නවා.සාකච්ඡා කරලා තියෙනවා .ස්ථිරසාර විසඳුමකට රජයක් විදිහට ස්ථාවර වෙමින් යන්නේ. එක පාරට ප්‍රශ්න විසඳෙන්නේ නෑ. ක්‍රමානුකූලව සුභවාදී පැත්තට යමින් තියෙනවා මුළු රටම. ඒ අනුව සුබවාදී දිසාවකට යනවා .ඒ සඳහා අපි ධෛර්යෙන් වැඩ කරමු කියන යෝජනාව කරමින් මම නිහඬවෙනවා ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා</u>**

ගරු සභාපතිතුමනි පුංචි පැහැදිලි කිරීමක් කරන්න ඕනේ. ගරු ඉන්දික මන්ත්‍රීතුමා කිව්ව පාර පස්වැටිච්ච එකක් ඒක ඇත්තටම ආර්.ඩී එකේ පාරක්. අපි දන්නවා පාරවල්වලට වැටිච්ච පස් කඳු අපි අයින් කරේ ශ්‍රමදායකත්වයෙන් තිබ්ච්ච කාර්යබහුලත්වයත් එක්ක ඒ පාරට අපිට යන්න බැරි වුනා. මන්ත්‍රීතුමා මොකද කරන්නේ වන්දියකුත් බලාපොරොත්තු වෙනවා බැංකුවේ වැඩ කරන සිකුරිටි කෙනෙක්ගේ ගෙයක්. ඒක අපි මොනවා හරි දැනුම් දීමක් කරනවා නම් ආර්.ඩී එකත් එක්ක තමයි කටයුතු කරන්න වෙන්නේ කියන එක තමයි කියන්න තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය</u>**

අපේ 2025 වර්ෂයේ බොහොම කාර්යබහුල විදියට ගෙවිල ගියා. ලැබිච්ච 2026 වසර කරදර දුක්කම්කටොළු නැති සුභ නව වසරක් වෙන්න කියලා පළමුවෙන්ම සියලු දෙනාටම ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම ජනවාරි පළවෙනිදා අපේ ලෙවංගම මෙහෙණි ආරාමයේ ධම්මිකාරාමයේ තිබුණ කිරි ආහාර පූජාවක් එතැනට ගියාට පස්සේ මෙහෙණින් වහන්සේ ඉල්ලීමක් කලා6.එතන අපද්‍රව්‍ය බැහැර කරන්න බැහැ කුණු ටික දාපුවහම වළවල් කපලා දැම්මත් දවසට දෙකට සවුත්තු වෙනවා .දුගඳ පැතිරෙනවා කිව්වා. පොඩි ඉඩමක්නෙ තියෙන්නේ. ඒ නිසා ප්‍රාදේශීය සභාවේ යන කුණු ට්‍රැක්ටරයට දෙන ක්‍රමවේදයක් සකස් කරල දෙන්න කියලා. ඉල්ලීමක් කළා ලෙවන්ගම ධම්මිකාරාමය මෙහෙණින් වහන්සේ ලියුමකුත් හදලා දෙන්නම් කියලා කිව්වා. සභාවෙත් ඒක යෝජනාවක් විදිහට අද ඉදිරිපත් කරනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

නොදිරණ ද්‍රව්‍ය පමණක් එකතු කරලා ටැක්ටරේ එන දාට දෙන්න කියන්න.
සියලු දෙනාටම ගොඩක් ස්තුතියි අදහස් දැක්වීම සම්බන්ධයෙන් සහ අද සභාවේ කටයුතු සඳහා සම්බන්ධ වීම සම්බන්ධයෙන් .වර්ෂයේ ආරම්භක සැසිවාරය තවත් ඉදිරි සැසිවාර එකොළහක් මේ සඳහා තියෙනවා.ඒ කටයුතුවලදී සභාවෙන් කරන හැම කටයුත්තක්ම ඔයාලා හැමෝටම දැනුම් දෙනවා. ඒකට වෙනම අපි වට්සැප් ගෲප් එකක් හදලා තියෙනවා. ඒකෙදී සියලු දේවල් අපි දැනුවත් කිරීම් කරනවා.ජනවාරි පළවෙනිදා ආරම්භක දවසේ වැඩි පිරිසක් ඇවිල්ල හිටියා ආරම්භක අවස්ථාවට.අපේ ලේකම්තුමා සඳහන් කළා අතීතයේ රැස්වීමක් සඳහා සාමාන්‍යයෙන් සභාපතිවරයා විතරයිලු සම්බන්ධ වෙන්නෙ. මේ සැරේ අපි ඇත්තටම සන්තෝස වෙනවා. වැඩි පිරිසක් එහිදී සහාය දුන්න ඇවිල්ලා හිටියා. අපි හැමෝම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා තුමියල්ලා සියලු දෙනා වගේම ඇවිල්ල හිටියා. පළවෙනි දවස කියන්නේ කාර්ය බහුලයි විවිධ දේවල් නිවාසවලත් තියෙනවා.එහෙම තියද්දිත් ඇවිල්ල දක්වපු සහායට සහෝදරත්වයට බැඳීමට ස්තුතිවන්ත වෙන්න ඕනේ. හැමෝම ඇවිල්ල කතාබහ කරලා ගියා. මේ වර්ෂයේ ඉදිරි කටයුතු කරන්න සියලු දෙනාගේම සහාය ලබා දෙන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා. අපි හැමෝම තමන්ගේ ගෙදර

වගේම කියල හිතාගෙන මේ කටයුතුවලට සම්බන්ධ වෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් අද දවසේ කටයුතු හමාර කරමු සියලු දෙනාටම ස්තුතියි.

ඒ අනුව ගරු මහා සභාවේ කටයුතු ප.ව 12.15 පමණ අවසන් විය .